බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07

பௌத்த அலுவல்கள் திணைக்களம்
இல. 135, ஶ்ரீமத் அநகாரிக தர்மபால மாவத்தை ,கொழும்பு 07

Department of Buddhist Affairs
No. 135, Srimath Anagarika Dharmapala Mawatha,Colombo 07

2025

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය අංකය - 201

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 -ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 -වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 -කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 -තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 -මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 -අනුකූලතා වාර්තාව

පටුන

1.පරිච්ඡේදය- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	
1.1 හැඳින්වීම	3-4
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර,අරමුණු	5
1.3 ප්‍රධාන කාර්යයන්	5
1.4 සංවිධාන සටහන	6
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / ප්‍රාදේශීය කාර්යාල	7-45
2.පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම	
2.1 2025 වසරේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන්	46-47
2.2 2026 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හා වැඩසටහන්	48-49
2.3 විශේෂ ජයග්‍රහණ හා අභියෝග	49-50
3.පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	51
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	52
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය	53
3.5 ආදායම් එකතු කිරිමේ ප්‍රකාශය	54
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	54
3.7 මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන	54
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරිමේ කාර්යසාධනය	54
3.9 විගණකාධිපති වාර්තාව	55-63
4. පරිච්ඡේදය -කාර්යසාධන දර්ශක	64
5. පරිච්ඡේදය -තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	
5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර අරමුණු	65
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	65
6. පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ	66
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	67
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිභය බලපාන ආකාරය	67
6.3 මානව සම්පත් සංවර්ධනය	67
7. පරිච්ඡේදය -අනුකූලතා වාර්තාව	
7.1 අනුකූලතා වාර්තා	68-72

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පරිදි බුද්ධාගම ප්‍රමුඛස්ථානයෙහි තබා ශ්‍රී සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ රාජ්‍ය වගකීම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වශයෙන්ම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වා ගෙන යාමට අදාල කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටු කරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියලුම සාමණේර/උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලැබේ.

සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම සඳහා එවකට පත් කරන ලද කමිටු නිර්දේශයක ප්‍රතිඵලයක් වශයෙන් 1981 ජුනි 01 දින බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එතෙක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහාභාරකාර දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද බුද්ධ ශාසනයට අදාළ කාර්යයන් ද ඇතුළත්ව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය උදෙසා වූ කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ ස්ථාපිත කර ඇති අතර, එම අංශ පහත පරිදි වේ.

01. පාලන අංශය
02. විහාර දේවාලගම් අංශය
03. දහම් පාසල් අංශය
04. භික්ෂු ලියාපදිංචි අංශය
05. සංවර්ධන අංශය
06. අභ්‍යන්තර විගණන අංශය
07. මුදල් අංශය
08. විමර්ශණ අංශය
09. තොරතුරු හා මාධ්‍ය අංශය
10. නීති ඒකකය

විහාර දේවාලගම් ආඥා පනතට අදාල කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසී ස්වාමීන් වහන්සේලාට ඉටු කර ගැනීම පහසු කරනු වස් පහත පරිදි ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කර ඇත.

01. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය
02. කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය
03. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය

බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන කාර්යයන් මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

පාලන අංශය මගින් ආයතනයේ අරමුණු සඵල කර ගැනීම සඳහා සේවක පරිපාලනය, ආයතන

කටයුතු පරිපාලනය හා දෙපාර්තමේන්තුවේ දේපල නඩත්තුව හා පාලනය සම්බන්ධ කටයුතු සිදු කරනු ලබයි.

විහාර දේවාලගම් අංශය මගින් 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ විධිවිධාන පරිදි අදාළ කාර්යයන් ඉටු කිරිම සිදු කරනු ලබයි. ඒ අනුව, 4(1) හා 4(2) පාලනය යටතේ පවතින සිද්ධස්ථාන සම්බන්ධ සියලුම කටයුතු සිදු කරනු ලබයි.

සංවර්ධන අංශය යටතේ දහම් පාසල් සංවර්ධන ආධාර ලබා දීම, නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු, සිල් මැණියන් වහන්සේලා පිළිබඳ කටයුතු, ශාසනාරක්ෂක මණ්ඩල සම්බන්ධ කටයුතු, ජාතික උත්සව සංවිධානය කිරිම, සිල්මාතා පුහුණු ආයතන ඇති කොට පවත්වාගෙන යාම, භික්ෂූන් හා සිල් මැණියන් වහන්සේලාගේ ධාරිතා සංවර්ධන පුහුණු කටයුතු , පනත් සම්බන්ධයෙන් වන සංශෝධන ආදී කටයුතු සිදු කරනු ලබයි.

විවිධ ආයතන මගින් සංවිධානය කරනු ලබන විශේෂ වැඩසටහන් සඳහා ආරාධනා හා ඉල්ලීම් අනුව දෙපාර්තමේන්තුවේ අවශ්‍ය සහාය හා සහභාගීත්වය ලබා දීම.

දහම් පාසල් අංශය මගින් දහම් පාසල් අධීක්ෂණය හා දහම් පාසල් සම්බන්ධ සියලුම පාලන කටයුතු සිදු කරනු ලබයි.

ආයතනයේ වියහියදම් පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරිම, ඒ සම්බන්ධ ගණන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදී මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටුකිරීම **ගිණුම් අංශය** මගින් සිදුවේ.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශවල හා ඊට අනුබද්ධිත ප්‍රාදේශීය කාර්යාලවල සහ විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානවල(විහාරස්ථාන සහ දේවාල) අවදානම් කළමනාකරණය, යහපාලනය හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීම හා උපදේශාත්මක කාර්යයක් සිදු කිරීම මෙන්ම එම සිද්ධස්ථාන විගණනයට ලක්කිරීම හා එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබාදීම **අභ්‍යන්තර විගණන අංශය** මගින් සිදු කෙරේ.

ඉහත අංශගත කාර්යයන්ට අමතරව පොදුවේ වාර්ෂිකව පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා තරඟ පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උළෙල පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කල හැකිය.

01.2 දැක්ම / මෙහෙවර / අරමුණු

දැක්ම

" බොදු පිළිවෙත් සුරකින දැහැමි සමාජයක් "

මෙහෙවර

"සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා ප්‍රවර්ධනය සඳහා වන කාර්යයන් හා කර්තව්‍යයන් මැනවින් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම තුළින්, දැහැමි හා ගුණගරුක සමාජයක් බිහි කිරීම සහ අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කිරීම "

අරමුණු

- ථෙරවාදී බුදුදහම ආරක්ෂා කිරීම හා බුද්ධ ශාසනයේ අනනුකූල පැවැත්ම සහතික කිරීම.
- සාංඝික දේපළ සුරක්ෂිත කිරීම, සංවිධානය කිරිම හා ඒවා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීම.
- බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කිරිම.
- අනාදිමත් කාලයක සිට බුද්ධ ශාසනය හා බැඳී පැවතෙන වත් පිළිවෙත් හා සම්ප්‍රදායන් ආරක්ෂා කොට අනාගතයට උරුම කර දීම හා කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරිම හා ප්‍රවර්ධනය කිරිම.
- බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරිම හා ප්‍රවර්ධනය කිරීම.
- සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා බෞද්ධ ජනතාව පෙළගැස්වීම සඳහා මග පෙන්වීම හා සහාය වීම.
- විහාරස්ථාන සංවර්ධනය සඳහා සම්බන්ධීකරණය කිරිම.

01.3 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන්

- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම හා ශාසනික නියාමන කටයුතු සිදු කිරීම
- විහාරස්ථාන සංවර්ධනය කිරීම.
- බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යාම, වැඩිදියුණු කිරිම හා දහම් පාසල් සංවර්ධනය කිරීම.
- දිවයිනේ සියලුම සාමණේර / උපසම්පදා භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කර ලේඛන පවත්වාගෙන යාම.
- සාමණේර / උපසම්පදා භික්ෂු පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම.
- සිල්මාතාවන් ලියාපදිංචිය, සිල්මාතා අභ්‍යාස ආයතන පවත්වාගෙන යාම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විහාරස්ථාන හා සිල්මාතා ආරාම ලියාපදිංචිය සිදු කිරීම.
- බෞද්ධ විශ්ව කෝෂ කාර්යාලය හා සංක්ෂිප්ත ත්‍රිපිටක මණ්ඩලය පවත්වාගෙන යාම.
- බොදු පිළිවෙතින් ශික්ෂණය ලද සමාජයක පැවැත්ම සහතික කිරීම් වස් සමාජ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

01.4 සංවිධාන සටහන



01.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / ප්‍රාදේශීය කාර්යාල

01.5.1 පාලන අංශය

දෙපාර්තමේන්තුවේ පාලන අංශය මඟින් ආයතනයේ පරිපාලනයට අදාලව රාජකාරි කටයුතු ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කල හැකිය.

01.5.1.1 පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු

- දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

01.5.1.2 ප්‍රවාහන කටයුතු

- වාහන අලුත්වැඩියා කිරීම, වාහන සේවා කිරීම හා වාහන රක්ෂණය කිරීම.
- දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා වාහන යෙදවීම.
- වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා ඉන්ධන යෙදීම.

01.5.1.3 ආයතනික කටයුතු

- දෙපාර්තමේන්තුව සඳහා නව තනතුරු ඇති කිරීම.
- තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීම, උසස් කිරීමේ පටිපාටි සකස් කිරීම
- කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම, නිල ඇඳුම් ලබා දීම හා යතුරු රාජකාරි පැවරීම.
- නිලධාරීන්ගේ නිවාඩු, විදේශ නිවාඩු හා නිලධාරිනීන්ගේ ප්‍රසූත නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- නිලධාරීන් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම.
- නිලධාරීන්ගේ අතිකාල වවුචර්පත් හා ගමන් වියදම් වවුචර්පත් භාර ගැනීම හා අනුමත කිරීම.
- පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- දෙපාර්තමේන්තුවේ ජල, විදුලි, දුරකථන, පුවත්පත් බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ තැපැල සම්බන්ධ සියළුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු හා විනය කටයුතු
- ආපදා ණය, දේපළ ණය හා අග්‍රහාර රක්ෂණයට සම්බන්ධ රාජකාරි කටයුතු
- නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ හා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අලුත්වැඩියා අභ්‍යන්තර චක්‍රලේඛ සකස් කිරීම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.
- මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් යොමු කිරීම සම්බන්ධ කටයුතු
- නිලධාරීන්ගේ රාජකාරි හැඳුනුම්පත් සකස් කිරීම.

01.5.1.4 මහානායක වාරිකාරාම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය

ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලාගේ නවාතැන් සඳහා වෙන් වූ කොළඹ 07 විජේරාම පාරේ අංක 115 දරන ස්ථානයේ පිහිටි වාරිකාරාම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු නාවික හමුදාව මඟින් සිදු කරනු ලබයි. 2021 වර්ෂයේ මෙම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූ අතර 2025 වර්ෂය සඳහා රු. මිලියන 43 ක ප්‍රතිපාදන වෙන් විය. ඉන් රු. 2,189,562.33 ක් වැය කර අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර එහි විදුලි සෝපානය හා ජෙනරේටරය ස්ථාපනය කිරීම සිදු නොකිරීමට තීරණය වූ නිසා රු. මිලියන 40.81 ක මුදලක් ඉතිරිවිය. 2026 වසර තුලදී එම අලුත්වැඩියා කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

01.5.1.5 පාලන අංශයේ ප්‍රගතිය.

අනු අංකය	ඉටු කරන ලද රාජකාරි	එකතුව
01	2025 වර්ෂයේ වාර්ෂික ස්ථානමාරු යටතේ වෙනත් ආයතන වෙත ස්ථාන මාරු වී ගිය සේවකයන් සංඛ්‍යාව	08
02	2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය යටතේ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි සේවකයන් ගණන	08
03	2025 වර්ෂය තුළ අනුමත කරන ලද ආපදා ණයගොනු සංඛ්‍යාව	237
04	2025 වර්ෂය තුළ අනුමත කරන ලද අග්‍රහාර අයදුම්පත්‍ර සංඛ්‍යාව	161
05	2025 වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	03
06	2025 වර්ෂය තුළ නිකුත් කරන ලද දුම්රිය බලපත්‍ර සංඛ්‍යාව	204
07	2025 වර්ෂය තුළ තොරතුරු ඉල්ලුම් කළ ලියාපදිංචි ගොනු සංඛ්‍යාව	394

01.5.2 මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපිත කරන ලද්දේ 2015 පෙබරවාරි 14 වන දින ය. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ අංශයෙහි ප්‍රධාන කාර්යය වන්නේ,

1. දෙපාර්තමේන්තුවේ වැඩසටහන් පිළිබඳ මාධ්‍ය ආවරණය හා ප්‍රචාරය ලබාදීම,
2. දෙපාර්තමේන්තුව සතු තොරතුරු හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ඒකරාශී කිරීම, යාවත්කාලීන කිරීමයි. එම තොරතුරු නිසි පරිදි සකස් කොට රාජ්‍ය හා පුද්ගලික අංශය වෙත මුදාහැරීමත් මෙම අංශය මඟින් සිදුකරයි.

01.5.2.1 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය (DBA HRMS)

මෙම මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතියට මඟින්,

1) සාමණේර උපසම්පදා ලියාපදිංචි සහතික දීපව්‍යාප්තව නිකුත් කිරීම
2) සිල්මාතා ලියාපදිංචි සහතික දීපව්‍යාප්තව නිකුත් කිරීම
3) දහම් පාසල් කළමනාකරණ දත්ත පද්ධතිය
4) විහාර දේවාල කළමනාකරණ දත්ත පද්ධතිය
5) සිල්මාතා ආරාම කළමනාකරණ දත්ත පද්ධතිය ආවරණය කරයි.

මෙම කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන වූ පසු පහත පරිදි තොරතුරු ලබා ගැනීමේ හා විශ්ලේෂණය කිරීමේ පහසුකම ඇතිවේ.

මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය (DBA HRMS)	විහාරස්ථානය හා නිකාය පාර්ශ්වය
	දේවාල හා බස්නායක නිලමේවරු/ භාරකාරවරු තොරතුරු
	ලියාපදිංචි විහාරස්ථානවල විහාරාධිපති ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු
	ලියාපදිංචි සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව
	විහාරස්ථාන දත්ත යටතේ ස්වාමීන් වහන්සේලාගේ අධ්‍යාපන තත්ත්වයන්
	විහාරස්ථාන දත්ත යටතේ වයස් අනුව ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු
	ලියාපදිංචි දසසිල් ආරාම තොරතුරු
	ආරාම දත්ත යටතේ දසසිල් මාතාවන් වහන්සේලාගේ තොරුතුරු
	ලියාපදිංචි දහම් පාසල
	දහම් පාසල් දත්ත යටතේ දහම් පාසල් ගුරු භවතුන්ගේ තොරතුරු
	දහම් පාසල් දත්ත යටතේ දහම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු
	විහාරස්ථාන හා සිල්මාතා ආරාම සඳහා මේ වන විට ලබා දී ඇති ආධාර (මධ්‍ය රජයෙන්/ පළාත් සභාවෙන්/ වෙනත්)

01.5.2.2 දෙපාර්තමේන්තු මුහුණුපොත පිටුව යාවත්කාලීනව පවත්වා ගැනීම (Face book / Face book Page)

දෙපාර්තමේන්තුවෙහි විවිධ වැඩසටහන් හා විශේෂ සිදුවීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස දෛනික යාවත්කාලීන සහිතව සිදුකරයි. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව නමින් ඇති නිල Face book හි Fallowes 8400 ක් හා following 117 ක් සහ Department of Buddhist Affairs නමින් ඇති Face book Page Face book හි Followers 3900 ක් හා following 16 ක් වේ.

01.5.2.3 යූටියුබ් චැනලය පවත්වා ගැනීම (You Tube – DBA Media)

දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන වැඩසටහන් හා කාලීන වශයෙන් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වැදගත් වන වීඩියෝ මෙම චැනලය මගින් විකාශනය කරමින් මහජනතාව දැනුවත් කිරීම සිදුකරයි. You Tube – DBA Media පරිශීලක නැරඹුම් වාර 2450 ක් වේ.

01.5.2.4 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dba.gov.lk) SLT සේවා අවකාශයේ ස්ථාපිත කර යාවත්කාලීන කිරීම සිදුවේ. එහි ප්‍රවෘත්ති, ඡායාරූප හා වීඩියෝ ස්ථාපනය කිරීම, විහාරස්ථාන / සිල්මාතා ආරාම හා දහම් පාසල් නාමාවලිය, දහම් පාසල් ක්ෂේත්‍රයට අදාළ වූ දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරන ලද පොත් හා අත්පත්‍රිකා, විවිධ අයදුම්පත්, නිකාය තොරතුරු, ශාසනාරක්ෂක මණ්ඩල තොරතුරු, ජාතික සිල්මාතා මණ්ඩලයේ තොරතුරු, තොරතුරු පණත සම්බන්ධ විස්තර ආදි වූ විවිධ අදාළ තොරතුරු බාගත කිරීමේ පහසුකම් සලසා ඇත.

01.5.2.5 මාධ්‍ය කටයුතු

දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සඳහා අවශ්‍ය මාධ්‍ය ප්‍රචාරය ලබාදීම, මාධ්‍ය වෙත තොරතුරු සැපයීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම, වැඩසටහන් ඡායාරූපගත කිරීම, එම ඡායාරූප අවශ්‍ය පුද්ගලයන් හා ආයතන වෙත ලබාදීම, එම ඡායාරූප සංරක්ෂණය කිරීම, විවිධ වාර්තා වැඩසටහන් සකස් කිරීම හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ සුබ පැතුම් පණිවුඩ නිකුත් කිරීම සිදුකරනු ලබයි.

01.5.2.6 දිනපතා පුවත්පත් වාර්තා පුවත්පත් වලින් අනාවරණය කරන කරුණු තහවුරු කරගැනීම පිණිස වාර්තා ලබාගැනීම.

දිනපතා පුවත්පත් වලින් අනාවරණය කරන විවිධ වාර්තා තහවුරු කරගැනීම පිණිස විවිධ පාර්ශවයන් වෙතින් වාර්තා ලබාගැනීම සිදුකරයි. බුදු දහමට නිගරු වන ආකාරයේ වාර්තා හා ඡායාරූප සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේලා වෙත සිදුවන විවිධ චෝදනා, අපහාස, අපකීර්ති හා ශාසනික අර්බුදකාරී වාර්තා සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් හා අනුමැතිය යටතේ අදාළ පාර්ශ්වයන් වෙත ලිපි නිකුත් කිරීම සිදුකරයි.

01.5.2.7 මාර්ගගත මෙහෙයුම්

01.5.2.7.1 රැස්වීම්, සාකච්ඡා සඳහා මාර්ගගත ක්‍රමයට සංවිධානය කිරීම / තොරතුරු මාර්ගගත ක්‍රමයට ගෙන්වා ගැනීම

දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන විවිධ රැස්වීම්/ සාකච්ඡා සඳහා මාර්ගගත ක්‍රමයට (online) අදාළව රැස්වීම් සංවිධානය කිරීම (MS office – Team) , විවිධ තොරතුරු මාර්ගගත ක්‍රමයට (online) ගෙන්වා ගැනීම පිණිස (MS Form) කටයුතු සිදුකරයි.

01.5.2.7.2 වට්ස් ඇප් සමූහ (Whatsapp)

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සමූහය (DBA – GOV.lk , DBA.DIS.lk), නිකාය / පාර්ශ්වය ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලාගේ සමූහ, ශාසනාරක්ෂක මණ්ඩල විධායක සභාව සඳහා පණිවුඩ හා තොරතුරු නිකුත් කිරීම සිදුකරයි.

01.5.2.7.3 විද්‍යුත් තැපැල (Email)

dba.gov.lk@gmail.com වෙත ලැබෙන පණිවුඩ, ඉල්ලීම් හා සේවා කඩිනමින් අදාළ අංශ වෙත යොමු කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකරයි.

01.5.3 විහාර දේවාලගම් අංශය

01.5.3.1 විහාර දේවාලගම් අංශයේ 2025-12-31 දිනට කාර්ය මණ්ඩලය

තනතුර	සංඛ්‍යාව
කොමසාරිස් (විහාර දේවාලගම්)	01 (ශ්‍රී.ලං.ප.සේ. 01)
නියෝජ්‍ය කොමසාරිස්	00 (ශ්‍රී.ලං.ප.සේ. 02)
ශාඛා ප්‍රධානි (විහාර දේවාලගම්)	01 (සංවර්ධන නිලධාරී සේවය 1)
සංවර්ධන නිලධාරීන් / බෞද්ධ කටයුතු සමායෝජක	08
කළමනාකරණ සේවා නිලධාරී	02
කාර්යාල කාර්ය සහායක	02

01.5.3.2 විහාර දේවාලගම් අංශය මඟින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) හා 4(2) වගන්ති යටතේ පාලනය වන සිද්ධස්ථාන වලට අනුව පහත රාජකාරී ඉටු කිරිම.

- බස්නායක නිලමේවරුන් හා භාරකරුවන් පත්කිරීමට අදාල කටයුතු.
- අනුමාන අයවැය හා අර්ධ වාර්ෂික සත්‍ය වියදම් වාර්තා ගෙන්වා ගැනීම හා නිවැරිදි බවට පරීක්ෂා කිරීම.
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ ගිණුම්වල පවතින මුදල් නිදහස් කිරීමේ කටයුතු.
- විහාරස්ථාන ලියාපදිංචි කිරීම.
- විහාරාධිපතිධූරය පිළිගැනීමේ ලිපි නිකුත් කිරිම හා ඒ සම්බන්ධ ගැටළු වලට අදාල රාජකාරී කටයුතු.
- විහාරස්ථාන සතු ඉඩම් හා දේපල බදුදීම් වලට අදාල රාජකාරී කටයුතු.
- සිද්ධස්ථාන සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු වලදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් සාක්ෂිකරුවකු ලෙස පෙනී සිටිම.

❖ **විහාරස්ථාන ලියාපදිංචි කිරිම**

විහාරස්ථාන ලියාපදිංචි කිරිමේදී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විහාරස්ථාන ලියාපදිංචි කිරිමේ අයදුම්පත විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමින් වහන්සේ විසින් සම්පූර්ණ කර අදාළ සිද්ධස්ථානය පිහිටි ඉඩමේ අයිතිය තහවුරු කරන ලේඛනද සමඟ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක/සංවර්ධන නිළධාරි විසින් විහාරස්ථානයක් ලෙස ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් අයදුම්පතෙහි සංක්ෂිප්ත වාර්තාවක් සමඟ ඉදිරිපත් කල යුතු අතර අදාළ ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය ද ලබා ගෙන විහාරස්ථානය අයත් නිකායේ මහානායක ස්වාමින් වහන්සේ වෙතින් විහාරාධිපතිත්වය තහවුරු කිරිමේ ලිපියක් සමග ඉදිරිපත් කල යුතුය.

2008.09.10 දිනට පසුව ආරම්භ කරන ලද විහාරස්ථාන ලියාපදිංචි කිරිමේ කිරීමේදී සඳහා ඉහත විහාරස්ථානය ලියාපදිංචි කිරීමේ අයදුම්පත, සිද්ධස්ථානය පිහිටි ඉඩමේ අයිතිය තහවුරු කරන ලේඛන සහ විහාරාධිපතිත්වය තහවුරු කිරිමේ ලිපිය සමග ඉදිරිපත් කල යුතුය. අදාළ ලේඛන ඉදිරිපත් කළ පසු බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් බුද්ධශාසන ,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා ගෙන විහාරස්ථාන ලියාපදිංචි කිරිමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

❖ **විහාරාධිපති ධූරයට පිළිගැනීමේ කටයුතු.**

විහාරස්ථානයක් ලියාපදිංචි කිරිමෙන් පසු සිදු කරනු ලබන වෙනස්වීමක දී, උදාහරණයක් වශයෙන් පෙර විහාරාධිපති ස්වාමින් වහන්සේ අපවත් වූ විට , වෙනත් ස්වාමින් වහන්සේ නමකට විහාරාධිපති ධූරය පැවරිමක් සිදු කර අතිපූජ්‍ය මහානායක ස්වාමින් වහන්සේ විසින් සිදු කරනු ලබන විහාරාධිපති පත් කිරිම් වල දී විහාරාධිපති ධූරය පිළිගත් බව දැනුම් දීම සඳහා විහාරාධිපති ලෙස පත් වූ ස්වාමින්

වහන්සේ, ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශිය බෞද්ධ කටයුතු කාර්යාල වලට පිටපත් සහිතව අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේ වෙත ලිපියක් නිකුත් කළ යුතුය.

❖ **විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) පාලනයේ පවතින විහාරස්ථාන හා දේවාලයන් හි භාරකාර පත්වීම් හා ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ ඇතුළු බස්නායක නිළමේවරුන් පත්කිරිම.**

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 7 වෙනි වගන්තිය යටතේ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ පත් කරනු ලබන අතර ඔහුගේ ධූර කාලය වසර 10ක් වේ. එසේම යථෝක්ත ආඥා පනතේ 8 වගන්තිය අනුව බස්නායක නිළමේ පත් කරනු ලබන අතර ඔහුගේ ධූර කාලය වසර 05 කි. බස්නායක නිළමේවරයෙකුගේ නිළ කාලය අවසන් වූ පසු අතිගරු ජනාධිපතිතුමා වෙත වර්ෂය බැගින් ධූර කාලය දෙවරක් දීර්ඝ කිරිමේ හැකියාව පවතින අතර නිල කාලය අවසන් වූ පසු නිළවරණයක් පවත්වා දියවඩන නිලමේ, බස්නායක නිළමේ තනතුර සඳහා පුද්ගලයින් තෝරා පත් කර ගනු ලැබේ.

විහාරස්ථානයක භාරකාරවරයෙකු පත් කිරිමේ දී විහාර දේවාලගම් ආඥා පනතේ 10 වගන්තිය යටතේ පත් කිරිම සිදු කරනු ලබන අතර එහිදී විහාරස්ථානයේ විහාරාධිපත් ස්වාමින් වහන්සේ භාරකාර ධූරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරිමෙන් පසු වසර 05 ක් සඳහා පත් කිරිම සිදු කරනු ලබන අතර භාරකාර ධූරය සඳහා විහාරාධිපති ස්වාමින්වහන්සේටද පත්විය හැක.

යථෝක්ත දියවඩන නිළමේ, බස්නායක නිළමේ සහ භාරකාර ධූරය වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ මුදලින් ඇප තැන්පත් කළ යුතුය.එහිදී අදාළ සිදිධස්ථානයේ ආසන්නතම වර්ෂයට අදාළ අර්ධ වාර්ෂික අයවැය වාර්තාවන් හි ආදායම් ශිර්ෂයෙහි එකතුවෙන් 5% ක් ප්‍රමාණයක් ඇප මුදල වශයෙන් තැබිය යුතුය.

❖ **විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන වල අනුමාන අයවැය හා අර්ධ වාර්ෂික අයවැය ගෙන්වා ගැනීම හා වත්කම් ලේඛන සකස් කිරිම භාරකාර සිද්ධස්ථානවල කටයුතු විගණනය සඳහා යොමු කිරිම.**

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයන් වෙත දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද අනුමාන අයවැය වාර්තාව ඉදිරි වර්ෂයට අදාළව අදාල සිද්ධස්ථානයේ දියවඩන නිළමේ ,බස්නායක නිළමේ සහ භාරකාර තැන විසින සකස් කර දෙපාර්තම්න්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුවේ.එසේම මාස 06ට වරක් එම වර්ෂයේ සත්‍ය ආදායම් වියදම් ඇතුලත් කරමින් අර්ධ වාර්ෂික අයවැය වාර්තාවක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරිම සිදු කළ යුතුවේ.

සිද්ධස්ථානයන් හි දේපළ සම්බන්ධ තොරතුරු ඇතුළත් කරමින් දෙපාර්තමේන්තුව මගින් වත්කම් ලේඛන සකස් කරනු ලබන අතර එහි පිටපතක් දෙපාර්තමේන්තුවටද අනික් පිටපත අදාළ සිද්ධස්ථානයේ දියවඩන නිළමේ හා භාරකාරතැන වෙතද භාර දෙනු ලැබේ.එසේ වත්කම් ලේඛන සකස් කිරිම මගින් එම ධූරය සඳහා පත්වන පුද්ගලයින් සඳහා භාණ්ඩ, ලිපිගොනු භාර දිමේදී විනිවිද භාවයෙන් සිදු කළ හැකිවේ.භාරකාර සිද්ධස්ථානවල විගණන කටයුතු සිදු කිරිම තුළින් අක්‍රමිකතා වලක්වා ගැනීමටත් විනිවිද භාවයකින් සිද්ධස්ථානයේ පරිපාලන හා මූල්‍ය කටයුතු පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් හා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව දැනුවත් කිරිමටත් හැකියාව ලැබේ.

❖ **විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයන්හි පඬුරු මුදල් බැංකු ගත කිරිමේ අධීක්ෂණ කටයුතු**

විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන ආදායම් ලබන සිද්ධස්ථානයන්හි පඬුරු මුදල් ගණනය කිරිමේ සහ බැංකු ගත කිරිමේ කටයුතු අධික්ෂණය සඳහා දෙපාර්තමේන්තු නිළධාරින් සහභාගි වේ.එහිදී එම පඬුරු මුදල් ගණනය කිරිම හා බැංකුගත කිරිමේ කටයුතු විධිමත්ව සහ විනිවිද භාවයකින් සිදු කිරිම මෙහි අරමුණ වන අතර එම පඬුරු මුදල් ආදායම් වාර්තාවන්හි එක් පිටපතක් දෙපාර්තමේන්තුවේද ගොනු ගත කරනු ලැබේ.

❖ **සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීමේ කටයුතු.**

සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීමේ දී විහාර දේවාලගම් ආඥා පනතේ 29 වගන්තිය අනුව බදු දීමේ කටයුතු සිදු කරනු ලබයි.එහිදී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදෙනු ලබන බදු අයදුම්පත සම්පූර්ණ කර බදු දෙනු ලබන ඉඩමේ පිඹුරේ පිටපතක් සහ බදු ගැනුම්කරුගේ හැඳුනුම්පතේ පිටපතක් සමග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.ඒ අනුව බදු ගන්නා කාර්යය අනුව ප්‍රාදේශිය ලේකම් වාර්තාව, තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව සහ අනෙකුත් අදාළ අයතනයන්හි වාර්තාවල නිර්දේශ අනුව බදු දීමේ කටයුතු සිදු කරනු ලබයි. එහිදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියෙන් යුතුව බදු ඔප්පු සකස් කරනු ලබයි.එසේම බදු දීමේ දී වර්ෂ 05 කට වරක් ප්‍රදේශයේ පවතින මිල ගණන් අනුව බදු මුදල සංශෝධනය සිදු කිරිම සිදු කරනු ලබයි.

❖ **බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිම.**

සිද්ධස්ථානයක පවතින ලියාපදිංචිය , විහාරාධිපති ධූරය ,ඉඩම් ආදී සිද්ධස්ථාන සම්බන්ධ ගැටළු පිළිබද නඩු කටයුත්තක් අධිකරණයේ විභාග වන අවස්ථාවලදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් අදාළ අධිකරණයේ පෙනී සිටිම සිදු කරනු ලබයි.

01.5.3.3 විහාර දේවාලගම් අංශය ඉටුකරනු ලබන සෙසු කාර්යයන්

- විහාරාධිපති ධූරය සංශෝධනය කිරිම.
- අපවත් වූ ස්වාමින්වහන්සේලා සතු බැංකු මුදල් අදාළ විහාරස්ථානයන්හි සංවර්ධන කටයුතු සදහා නිදහස් කිරිම.
- විහාරස්ථාන හා දේවාල සන්තක ඉඩම් වල ගස් කැපීම හා විකිණීමට අනුමැතිය දීම.
- පූජා ඔප්පු නිර්දේශ ලබා දීම.
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ වාහන පැවරීමේ කටයුතු
- භික්ෂූන් වහන්සේලා විසින් පෞද්ගලිකව මිලදී ගත් දේපල අදාළ ඉල්ලීම මත සඟසතු නොවන බව දැනුම් දීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් වල පවත්වාගෙන යනු ලබන ආරණ්‍ය සේනාසනන සදහා නිර්දේශ ලබා දීම.
- මැණික් පතල් බලපත්‍ර සදහා නිර්දේශ ලබා දීම.
- සිද්ධස්ථාන සතු ඉඩම් වෙනුවෙන් හිමි මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් වන්දි මුදල් අදාළ සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් වෙනුවෙන් නිදහස් කිරිමට අදාළ රාජකාරි.
- මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් විවිධ භාරයන්හී පොලී මුදල් එම සිද්ධස්ථානයේ පරිපාලන කටයුතු සහ සංවර්ධන කාර්යන් වෙනුවෙන් නිදහස් කිරිමට අදාළ කටයුතු.
- විහාරස්ථාන දේපල අත්පත්කර ගැනීම මත හිමිවන වන්දි මුදල් නිදහස් කිරීමේ රාජකාරී (මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් වන්දි මුදල් හා පොලී මුදල්)
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ වාහන පවරා දීමේ රාජකාරී කටයුතු.
- තොරතුරු පනත යටතේ සිදුකරන ඉල්ලීම් වලට අදාල තොරතුරු ලබා දිම.

01.5.3.4 විහාර දේවාලගම් අංශයේ 2025-12-31 දිනට අදාල ප්‍රගතිය.

අනු අංකය	ඉටු කරනු ලබන රාජකාරි	එකතුව
1	විහාරස්ථාන ලියා පදිංචි කිරීම	84
2	විහාරාධිපති ධූර පත් කිරීමේ ලිපි පිළිගැනීම	359
3	විහාරාධිපති ධූර සංශෝධන කිරීම	32
4	විහාරාධිපති ධූර සම්බන්ධයෙන් අතිපූජ්‍ය මහා නායක ස්වාමීන් වහන්සේ වෙතින් තහවුරු කිරීම විමසීම්	58
5	නිකාය පාර්ශව සංශෝධන කිරීම	08
6	නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනීම	88

7	නව සිද්ධස්ථාන ලියපදිංචිය සම්බන්ධයෙන් බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබා ගැනීම.	85
8	නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් ගැටලු නිරාකරණය කිරීම	205
9	සිද්ධස්ථාන අයිතිය සම්බන්ධයෙන් අධිකරණයේ පෙනී සිට සාක්ෂි ලබාදීම	28
10	පූජාභූමි පිළිබඳ නිර්දේශ ලබාදීම	00
11	පූජා ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම	01
12	දේපළ අයිතිය පිළිබඳ ලිපි ලබාදීම	29
13	පදිංචිය පිළිබඳ තහවුරු කර ලිපි ලබාදීම	13
14	සිද්ධස්ථානසතු දේපළ බදු දීම හා අදාල රාජකාරී (ප්‍රාදේශීය ලේකම් වාර්තා, තක්සේරු වාර්තා ගෙන්වා ගැනීම හා බදු කෙටුම්පත් සකස් කිරීම ඇතුළුව)	103
15	අනුමාන අය වැය වාර්තා ගෙන්වා ගැනීම	90
16	අර්ධ වාර්ෂික අය වැය ලේඛන ගෙන්වා ගැනීම	64
17	අපවත් වූ ස්වාමින් වහන්සේලාගේ ගිණුම් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම්	101
18	අපවත් වූ ස්වාමින් වහන්සේලාගේ වාහන පැවරීම්	13
19	සිද්ධස්ථාන සතු ගස් කැපිමට අනුමැතිය ලබාදීම්	32
20	බස්නායක නිලමේවරුන් පත් කිරීමට අදාළ නිලවරණ පැවැත්වීම්	11
21	ගැටලු නිරාකරණය සඳහා විශේෂ රැස්වීම් පැවැත්වීම්	12
22	විවිධ පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහ චෝදනා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම්	130
23	අති පූජ්‍ය මහා නායක ස්වාමින් වහන්සේලා වෙතින් උපදෙස් සහ අනුශාසනා ලබා ගැනීම්	105
24	වෙනත් නීතිමය ආයතන වෙත තොරතුරු ලබාදීම්	55
25	පණතට අදාළ තොරතුරු සහ වෙනත් ආයතන වෙතින් ඉල්ලන තොරතුරු ලබාදීම්	116
26	ජනාධිපති කාර්යාලය මගින් යොමු කරනු ලබන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම්	99
27	අග්‍රාමාත්‍ය කාර්යාලය වෙතින් ලැබෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම්	59
28	ඔප්පු ලියා පදිංචි කිරීමට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත නිර්දේශ ලබාදීම්	19
29	විගණන වාර්තා සම්බන්ධයෙන් සිද්ධස්ථාන වෙත හෝ ප්‍රාදේශීය කාර්යාල වෙත උපදෙස් ලබාදීම්	13
30	භාරකාර ඇප මුදල් නිදහස් කිරීම්	06
31	ඇප මුදල් තැන්පත් කිරීම්	31
32	ප්‍රාදේශීය කාර්යාල වෙත ලිපි යොමු කිරීම්	341
33	ප්‍රාදේශිය ලේකම් වාර්තා ගෙන්වාගැනීම	166
34	භාරකරුවන් පත් කිරීම්	24
35	විවිධ ලිපි	196

01.5.4 භික්ෂු ලියාපදිංචි අංශය

01.5.4.1 2025-12-31 දිනට භික්ෂු ලියාපදිංචි අංශයේ කාර්ය මණ්ඩලය

තනතුර	සංඛ්‍යාව
කොමසාරිස් (විහාර දේවාලගම්)	01
නියෝජ්‍ය කොමසාරිස් (විහාර දේවාලගම්)	00
ශාඛා ප්‍රධානි (භික්ෂු ලියාපදිංචි)	01
සංවර්ධන නිලධාරීන් / බෞද්ධකටයුතු සමායෝජක	07
කළමනාකරණ සේවා නිලධාරී	01
කාර්යාල කාර්ය සහායක	02

01.5.4.2 භික්ෂු ලියාපදිංචි අංශයේ ප්‍රධාන කාර්යයන්

- නව සාමණේර ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- ලියාපදිංචි කරන ලද සාමණේර හා උපසම්පදා ප්‍රකාශ පත්‍රවල සහතික පිටපත් නිකුත් කිරීම.
- සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍රවල අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- උපැවිදි සහතික නිකුත් කිරීම.
- නීතිමය ගැටළු වලදී අවශ්‍ය සාක්ෂි ලබා දීම.
- භික්ෂු හැඳුනුම්පත් නිකුත් කිරීම.
- නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම.

01.5.4.3 භික්ෂු ලියාපදිංචි අංශයේ විශේෂ වැඩ සටහන්

- නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
- විශ්ව විද්‍යාල ප්‍රවේශලාභී ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩ සටහන් පැවැත්වීම
- සාමණේර හා උපසම්පදා ලේඛණ පර්යාවලෝකනය කර පරිඝණකගත ගොනු සකස් කිරීම.

01.5.4.4 භික්ෂු ලියාපදිංචි අංශයේ 2025.01.01 දින සිට 2025-12-31 දිනට විශේෂ වැඩ සටහන් වලට අදාල ප්‍රගතිය

- ❖ **සාමණේර හා උපසම්පදා ලේඛණ හා තොරතුරු පරිගණක ගත කිරීම.**

1931අංක 19 බෞද්ධ විහාර දේවාලගම් පනතට අනුව පැවිදි දිවියට ඇතුළත් වන සහ උපසම්පදාව ලබන සියළු භික්ෂූන් වහන්සේලා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. එම ආඥා පනත බලාත්මක වු දා පටන් මේ දක්වා (2025-12-31 දින වන විට සාමණේර ස්වාමීන් වහන්සේලා 126475 නමක් හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා 63638 නමක් වශයෙන් ලියාපදිංචි වී ඇත. මෙසේ ලියාපදිංචි කරන ලද සාමණේර හා උපසම්පදා සහතික Scan කර සහතික 100 බැගින් වු මෘදු ගොනු සකස් කර ඇත.

මෙසේ සකස් කරන ලද මෘදු ගොනු භාවිත කරමින් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වන රත්නපුර, මහනුවර හා කුරුණෑගල යන කාර්යාල මගින් සාමණේර හා උපසම්පදා සහතික පිටපත් නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර අතර තව දුරටත් එම සේවාව පුළුල් කරමින් 2020 මාර්තු මාසයේ සිට දිවයිනේ සියළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින්(කොළඹ,මහනුවර,කුරුණෑගල,රත්නපුර හැර) පිටපත් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

- ❖ **නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

සම්බුදු සසුනේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් විනයගරුක ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලා බිහිකර ගැනීම උදෙසා නවක සාමණේර සහ උපසම්පන්න භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කරන්නා වූ දැනුම අවබෝධය සහ හික්මීම කුඩා කල සිටම ලබා දීම අරමුණු කරගනිමින් බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව එක්ව ලංකාවේ වැඩසිටින නවක සාමණේර හා උපසම්පන්න භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලාගේ හා විද්වත් ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා පරිදි කුසලස්ස උපසම්පදා නමින් භික්ෂු පුහුණු වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කිරීමේ වැඩ සටහනක් 2017 වර්ෂයේදී ආරම්භ කර මේ දක්වා පවත්වාගෙන එනු ලබයි. එම වැඩසටහන් මඟින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ.

- දැනට ලංකාවේ වැඩ වාසය කරන නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ ඇවතුම් පැවතුම්, ආගමික වත්පිළිවෙත් හා පැවිදි දිවිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම ලබා දීම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
- සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාට ආගමික කටයුතු ඉටු කිරීම පිළිබඳව පුහුණුවක් ලබා දීම හා ස්වාමීන් වහන්සේලාගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම

කුසලස්ස උපසම්පදා පුහුණු වැඩසටහන පැවැත්වීමේදී අවධානය යොමු කරනු ලබන කරුණු

- පෞරුෂ සංවර්ධනය (ඉදිරිපත් වීම, අභියෝග භාර ගැනීම, දරා ගැනීමේ ශක්තිය හා ඉවසීම ඇති කිරීම, සබකෝලය මග හැර ගැනීම)
- හැකියාවන් හා කුසලතා හඳුනා ගැනීම
- සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ඇති කිරීම
- සාසනික වත් පිළිවෙත් හුරු කරවීම
- අන් අයට හා අන් මතයන්ට ගරු කිරීම
- ත්‍රිපිටකාශ්‍රිත මූලික දැනුම වර්ධනය කිරීම
- පාලි සංස්කෘත ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ මූලික අවබෝධය
- දේශනා ගායනා සහ සජ්ඣායනා පිළිබඳ කුසලතා වර්ධනය
- භාවනාව පිළිබඳ මූලික අවබෝධය
- විනය ශික්ෂා පිළිබඳ අවබෝධය පුළුල් කිරීම

කුසලස්ස උපසම්පදා පුහුණු වැඩසටහන පවත්වන ක්‍රමවේදය

මෙම වැඩ සටහන නේවාසික පුහුණුවක් ලෙසින් පැවැත්වේ. දෛනික කාලසටහනකට අනුව විද්වත් ස්වාමීන් වහන්සේලා විසින් පවත්වනු ලබන දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් පුහුණුව ලබා දීම සිදු කරනු ලබයි.

2025.12.31 දක්වා කාලය තුල දී හා අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාල ප්‍රවේශලාභී ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩ සටහන් 01 ක් සහ නවක සාමණේර උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩ සටහන් 01 ක් ලෙස වැඩ සටහන් 02 ක් පන්නිපිටිය දෙව්රම් මහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පවත් වන ලදී. එම වැඩ සටහන් පිළිබඳ විස්තර (ප්‍රගතිය) පහත දැක්වේ.

දිනය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව	වියදම (රුපියල්)
2025.01.20 සිට 2025.01.25 (විශ්ව විද්‍යාල ප්‍රවේශ ලාභී ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන)	පන්නිපිටිය ශ්‍රී දෙව්රම් මහා විහාරය	88	නැත
2025.08.12 සිට 2025.08.19 (නවක සාමණේර උපසම්පදා ස්වාමින් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන)	පන්නිපිටිය ශ්‍රී දෙව්රම් මහා විහාරය	111	224,261.00
2025.09. සිට 2025.09.28 (නවක සාමණේර උපසම්පදා ස්වාමින් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන)	පන්නිපිටිය ශ්‍රී දෙව්රම් මහා විහාරය	100	240,000.00
එකතුව		199	224,261.00

2025 වර්ෂයේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා කාල සීමාව තුළ විශ්ව විද්‍යාල ප්‍රවේශලාභී ස්වාමීන් වහන්සේලා සහ නවක සාමණේර උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන් 04 පැවැත්වීමට කටයුතු සංවිධානය කොට ඇත.

01.5.4.5 භික්ෂු ලියාපදිංචි අංශය විසින් 2026 වසරේ පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් වල විස්තර

2026 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කාල සීමාව තුළ "කුසලස්ස උපසම්පදා" පුහුණු වැඩසටහන යටතේ විශ්ව විද්‍යාල ප්‍රවේශලාභි ස්වාමීන් වහන්සේලා සහ නවක සාමණේ උපසම්පදා ස්වාමීන් වහන්සේලා 100 නමක් බැගින් සහභාගි කර ගනිමින් පන්නිපිටිය ශ්‍රී දෙව්රම් වෙහෙර මහා විහාරය කේන්ද්‍ර කර ගනිමින් පුහුණු කිරීමේ වැඩසටහන් 12 ක් පැවැත්වීමට නියමිතව ඇත.

01.5.4.6 භික්ෂු ලියාපදිංචි අංශයේ 2025 වසර සඳහා විශේෂ වැඩසටහන්වල විස්තර

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික හැඳුනුම්පතට අමතරව ස්වාමීන් වහන්සේලා සඳහා විශේෂ භික්ෂු හැඳුනුම්පත් නිකුත් කිරීම.
- නවක සාමණේර සාමණේර ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන් 04 පැවැත්වීම.
- නවක උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් වැඩසටහන් 05 ක් පැවැත්වීම.
- විශ්ව විද්‍යාල ප්‍රවේශලාභි ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

විශ්ව විද්‍යාල ප්‍රවේශ ලාභි ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන

නවක සාමණේර උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන

01.5.4.7 භික්ෂු ලියාපදිංචි අංශයේ 2025-01-01 සිට 2025-12-31 දින දක්වා ප්‍රධාන කාර්යන්ට අදාල ප්‍රගතිය

- ලියාපදිංචි කරන ලද නව සාමණේර ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව - 3176
- ලියාපදිංචි කරන ලද නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව - 1144
- නිකුත් කරන ලද සාමණේර හා උපසම්පදා සහතික පිටපත් සංඛ්‍යාව - 18023
- උපසම්පදා හා සාමණේර සහතික පත්‍රවල සිදුකල සංශෝධන සංඛ්‍යාව - 0440
- නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව - 2194
- නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව - 0085

01.5.5 නීති ඒකකය

බෞද්ධ කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් හෝ බෞද්ධ කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ වෙනත් වගකිව යුතු නිලධාරින් වගඋත්තරකරු හෝ පිත්තිකරු ලෙස නම් කරමින් පවරන ලද හෝ ඉදිරියට පවරනු ලබන නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සහ පිටපළාත් අධිකරණ වල රජයේ නීතිඥවරු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් නීතිමය රාජකාරි ඉටුකිරීම හා නඩු පවරා තිබෙන අධිකරණ (දිසා අධිකරණ, සිවිල් අභියාචනාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණ) අනුව අවශ්‍ය නීතිමය කටයුතු ඉටුකිරීම, නීති නිරීක්ෂණ ලබාදීම හා අවශ්‍ය අවස්ථා වල නඩු සඳහා පෙනීසිටීම බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පවරනු ලබන වෙනත් රාජකාරි නීති අංශය මඟින් ඉටු කිරීම.

01.5.5.1 නීති ඒකකයේ කාර්යභාරය

බුද්ධශාසන අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තු විෂය පථයට අදාළ නීති කෘත්‍යයන් සම්බන්ධ නඩු වල අදාළ කාර්යයන් සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තු විෂය පථයට අදාළව පනත්, සිද්ධස්ථාන සතු දේපළ, බදු ලබා දීම, විහාරාධිපති ධූර සහ වෙනත් විෂය ගොනුවලට අදාළ නෛතික කාර්යයන් ඉටුකිරීම නීති අංශයේ කාර්යභාරය වේ.

❖ **දිසා අධිකරණ, සිවිල් අභියාචනාධිකරණය, අභියාචනාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවලට අදාළ කාර්යයන්**

- නඩුවලට අදාළව ගොනු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.
- නඩුවලට අදාළ විෂය ගොනු එක්රැස් කිරීම සහ අදාළ ලේඛන රැස්කිරීම.
- පෙරකලාසි සකස් කිරීම හා සම්පූර්ණ කරන ලද පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුවට හා පිටපළාත් අධිකරණවල රජයේ නීතිඥවරුන් වෙත භාරදීම.
- නඩුවලට අදාළ විෂය ගොනු අධ්‍යයනය කිරීම.
- නිරීක්ෂණ සැකසීම.
- දිව්රුම් ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම.
- නියමිත දිනට පෙර නීතිපති දෙපාර්තමේන්තුව වෙත හා පිට පළාත් අධිකරණවල රජයේ අධිනීතිඥවරුන් වෙත නිරීක්ෂණ ලබා දීම.

- සාක්ෂි ලැයිස්තු සැකසීම.
- අවශ්‍ය අවස්ථාවල අධිකරණයේ පෙනී සිටීම.
- නඩුවලට අදාළ විභාග සටහන් සහ කාර්ය සටහන් පිටපත් ලබා ගැනීම.
- නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දෙන අවස්ථාවලදී අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුව සමඟ නඩු සම්බන්ධව නීති උපදේශන සාකච්ඡා සඳහා සහභාගී වීම.

❖ **විවිධ අංශවලින් ඉදිරිපත් කරන විෂය ගොනුවලට අදාළ කාර්යයන්**

- බදු කෙටුම්පත් පරීක්ෂාව හා ඊට අදාළ නිරීක්ෂණ ලබාදීම.
- සිද්ධස්ථාන සතු දේපළවලට අදාළ නිරීක්ෂණ ලබා දීම.
- විහාරාධිපති ධූරය හා ඊට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාදීම.
- ප්‍රාදේශීය කාර්යාල හා සම්බන්ධ ගොනුවලට අදාළ නිරීක්ෂණ ලබා දීම. (මහනුවර / රත්නපුර / කුරුණෑගල)
- බුද්ධශාසන අමාත්‍යංශය මගින් යොමු කරනු ලබන නඩු හා පනත් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දීම.
- නීතිපති දෙපාර්තමේන්තුව වෙත නීතිපති උපදෙස් සඳහා යොමු කරනු ලබන නඩු නොවන වෙනත් ගොනු සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ (පාලන, දහම් පාසල්, සංවර්ධන, විහාර දේවාලගම්, භික්ෂු ලියාපදිංචි) අංශ මගින් යොමු කරනු ලබන ගොනු වල සඳහන් නෛතික කරුණු සම්බන්ධව නිරීක්ෂණ ලබා දීම.

❖ **වෙනත් කාර්යයන්**

- නඩු ලේඛනය සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
- නීති අංශයට අදාළව පොදු ගොනුව සහ නීති ලේඛන ගොනුව පවත්වාගෙන යාම.
- විවිධ අංශ විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සඳහා සහභාගී වීම.
- බස්නායක නිලමේ පත්කිරීම් නිලවරණය සඳහා සහභාගී වීම.
- පනත් කෙටුම්පත් සම්බන්ධ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු සිදු කිරීම.

❖ **බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.**

01.5.5.2 නීති ඒකකයෙහි ඉදිරි ඉලක්ක

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට විරුද්ධව අධිකරණ වල ගොනු කර තිබෙන නඩු කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම, පවරා තිබෙන නඩු වලට අදාලව ඉදිරි නීතිමය කටයුතු කඩිනමින් ඉටු කිරිම, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට විරුද්ධව ගොනු කරනු ලබන නඩු ප්‍රමාණය අඩු කර ගැනීම පිණිස අවශ්‍ය නෛතික සහාය අදාළ නිලධාරින්ට ලබා දීම.

01.5.5.3 නීති ඒකකයෙහි ප්‍රගතිය

නීති අංශයෙහි පවත්නා නඩු ලේඛනය අනුව 2024 .12.31 දිනට නඩු 318 ක් පවතින අතර, ඉන් නඩු 199 ක ප්‍රමාණයක් 2024.12.31 දිනට අවසන් වී ඇත.

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා නඩු 25 ක ප්‍රමාණයක් අලුතින් ගොනු කර ඇත. මේ වසර තුල හා පෙර වසර වල ගොනු කර තිබෙන නඩු වලින් නඩු 13 ක ප්‍රමාණයක් මේ වසර තුළ (2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාලය තුළ) අවසන් වී ඇත. ඒ අනුව 2025.12.31 දිනට නඩු 131 ඇත. (නඩු ලේඛනය අනුව 2025.12.31 දිනට නඩු 343 ක් පවතින අතර එම නඩු වලින් නඩු 212 ක් අවසන් වී ඇත. නඩු 131 ක ප්‍රමාණයක් ඉදිරියට පවතියි.

අනු අංකය	අධිකරණය	නඩු ගණන
01	ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	06
02	අභියාචනාධිකරණ නඩු	31
03	පලාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ නඩු	14
04	දිසා අධිකරණ නඩු	80
	එකතුව	131

නීති අංශයෙහි 2025.01.01 දිනට පැවති නඩු ගොනු හා 2025.01.01 දින සිට 2025.12.31 කාලසීමාව තුළ අළුතින් ගොනු කර තිබෙන නඩු වලින් (බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරින් වගඋත්තරකරුවන්/ විත්තිකරුවන් ලෙස නම් කර තිබූ නඩු වලින්) මුදා හැරීම, නිදහස් කිරීම මත එම නඩු කටයුතු වල තීන්දු මඟින් දෙපාර්තමේන්තුවට අගතියක් නොවන පරිදි අවසන් කර ගැනීමට හැකි වී ඇත. නීති අංශය වෙත විවිධ අංශ මඟින් යොමු කරනු ලබන විවිධ විෂය කරුණු වලට අදාල ගොනු සම්බන්ධයෙන් නිරීක්ෂණ නියමිත පරිදි ලබා දී ඇත.

01.5.6 සංවර්ධන අංශය

01.5.6.1 සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්

- ශාසනික සංවිධාන කටයුතු
- යටිතල පහසුකම් සංවර්ධන කටයුතු
- පුහුණු කටයුතු

මීට අමතරව සංවර්ධන අංශයේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ දෙපාර්තමේන්තුවේ කටයුතු තවත් ආයතන 05 මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

- ශාසනාරක්ෂක මණ්ඩල කාර්යාලය
- බෞද්ධ විශ්වකෝෂකාර්යාලය
- මුලටියන දසසිල් මාතා පුහුණු අභ්‍යාස ආයතනය
- ඊරියවැටිය දසසිල් මාතා පුහුණු අභ්‍යාස ආයතනය හා ජාතික දසසිල් මාතා සංගම් මූලස්ථානය
- අනුරාධපුර දසසිල් මාතා පුහුණු අභ්‍යාස ආයතනය

01.5.6.2 සංවර්ධන අංශයේ කාර්යභාරය

❖ **ජාතික හා ආගමික උත්සව සම්බන්ධීකරණය**

- රාජ්‍ය වෙසක් උත්සවය සඳහා දායකත්වය ලබාදීම
- රාජ්‍ය පොසොන් උත්සවය සඳහා දායකත්වය ලබාදීම
- ජාතික නිදහස් උත්සවය වෙනුවෙන් පිරිත් දේශනාව පැවැත්වීම හා ජාතික නිදහස් දින ආගමික වැඩසටහන් පැවැත්වීම
- ආදාහන කටයුතු සඳහා ආධාර ලබාදීම
- උපසම්පදා උත්සවයන්හි දී උපසම්පදා අපේක්ෂක ස්වාමින්වහන්සේලා වෙත ගමන් වියදම් දීමනා ගෙවීම
- වාර්ෂිකව සංඝමිත්තා ගුණ සමරු උළෙල සංවිධානය කිරීම
- මහානායක ස්වාමින්වහන්සේලා වෙනුවෙන් පැවැත්වෙන විශේෂ උත්සව සංවිධාන කටයුතු සඳහා සහයෝගය ලබාදීම

❖ **ශාසනික සංවිධාන කටයුතු**

- සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු සංවිධානය සඳහා සහාය වීම හා අදාළ පහසුකම් සැලසීම
- ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු සම්බන්ධීකරණය කිරීම

- දිස්ත්‍රික් සිල්මාතා හා ජාතික මණ්ඩල රැස්වීම් සම්බන්ධීකරණය සඳහා සහාය වීම හා පහසුකම් සැලසීම
- ත්‍රිපිටකය රෝමන් අකුරට හැරවීමේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම
- ශ්‍රී මහා බෝධි සංවර්ධන අරමුදල හා රන්වැට සංරක්ෂණය අරමුදල සම්බන්ධීකරණය කිරීම
- බෞද්ධ විශ්වකෝෂයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- නිකාය/පාර්ශ්ව මූලස්ථානවලට පහසුකම් ලබාදීම

❖ **ශාසනික සංවර්ධන කටයුතු**

- සිල්මැණියන් වහන්සේලා ලියාපදිංචි කිරීම හා උපැවිදි සහතික නිකුත් කිරීම
- සිල්මාතා හැඳුනුම්පත් සකස් කිරීම
- සිල්මාතා ආරාම ලියාපදිංචි කිරීම
- විහාරස්ථාන හා සිල්මාතා ආරාම දායක සභා ලියාපදිංචි කිරීම
- කාර්ය සාධක සමිති ලියාපදිංචිය සඳහා නිර්දේශ ලබාදීම
- විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරීම
- දුෂ්කර විහාරස්ථාන වෙත සිව්පස ආධාර ලබා දීම
- අට පිරිකර නිෂ්පාදනය සම්බන්ධව ප්‍රමිතිය සකස් කිරීම හා අලෙවිසැල් ලියාපදිංචි කිරීමට පියවර ගැනීම
- විහාරස්ථාන සඳහා සූර්ය පැනල ලබාදීමේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම
- රේගු නිශ්කාෂණවාර්තා ලබාදීම

❖ **යටිතල පහසුකම් සංවර්ධන කටයුතු**

- ඌණ සංවර්ධිත දහම් පාසල් සඳහා පහසුකම් සැලසීම (දහම් පාසල් ගොඩනැගිලි හා උපකරණ ද්‍රව්‍ය ලබාදීම)
- "මිහිඳුසෙවණ" ව්‍යාපෘතිය සඳහා නිර්දේශ ලබා දීම
- ශාසනාරක්ෂක මණ්ඩල සඳහා උපකරණ ලබා දීම
- සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනවල භෞතික සංවර්ධන කටයුතු සිදු කිරීම

❖ **පුහුණු වැඩසටහන්**

- නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා සඳහා "කුසලස්ස උපසම්පදා"නම් පුහුණු වැඩසටහන පැවැත්වීම
- විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගරු සභාපති, ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- "අංජලිකරණී" නමින් දීප ව්‍යාප්තව සිල්මාතා පුහුණු වැඩසටහන් පැවැත්වීම

01.5.6.3 2025 වර්ෂයේ සංවර්ධන අංශයේ ප්‍රගතිය

❖ **රාජ්‍ය වෙසක් උත්සවය**

2025 වසරේ රාජ්‍ය වෙසක් උත්සවය ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ සහභාගීත්වයෙන් නුවරඑළිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලද අතර ඊට සමගාමීව පහත ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරන ලදී.

❖ **භක්ති ගීත හා බොදු ගී ගායනා**

ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතන ද නියෝජනය කරමින් රාජ්‍ය නිලධාරීන් භක්ති ගී ගායනා වැඩසටහන් සඳහා එක්ව සිටියහ. මීට අමතරව ටවර් හෝල් පදනම මගින් බොදු නූර්ති බැති ගී ඉදිරිපත් කළ අතර සර්වාගමික දහම් පාසල් දරු දැරියන් විසින් ද භක්ති ගී වැඩසටහනට දායකත්වය ලබාදෙන ලදී.

❖ **සංස්කෘතික ප්‍රදර්ශනය**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව එක්ව නුවරඑළිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් සංස්කෘතික ප්‍රදර්ශනය පවත්වන ලදී.

❖ **පරිසර සංරක්ෂණ වැඩසටහන**

නුවරඑළිය දිස්ත්‍රික් සියලු පාසල් ආවරණය වන 'පරිසරය සුරකිමු' යන තේමාව යටතේ දැනුවත් කිරීමේවැඩසටහන්, විධිමත් කසල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම්,ශ්‍රමදාන සංවිධානය හාරුක් රෝපණවැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද මේ යටතේ සිදු කරන ලදී.

❖ **සාරධර්ම ප්‍රවර්ධනය**

බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් ආගමික දරුවන් සහභාගී කර ගනිමින් ආගමික අනන්‍යතාව, සහයෝගිතාව හා ආගමික සාරධර්ම ප්‍රකාශවන ආකාරයේ පෙරහැර පැවැත්වීම මේ යටතේ සිදු කරන ලදී.

❖ **සෞඛ්‍ය වැඩසටහන්**

සෞඛ්‍යමය දිවි පෙවෙතත් උදෙසා දේශීය ආහාර පරිභෝජනයට ගැනීම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සහ උනන්දු කිරීම සඳහා වන වැඩමුළුවක් සහ ප්‍රදර්ශනයක් පැවැත්වීම, ලේ දන් දීමේ සහ අක්ෂි සායන වැඩසටහන් පැවැත්වීම යනාදිය විහාරස්ථාන, දේවස්ථාන හා පල්ලි කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලදී. 2025 වසරේ රාජ්‍ය වෙසක් උත්සවය සමස්ත වැඩසටහන සඳහා වෙන් වූ ප්‍රතිපාදන (රු. මි.) 12 ක් වන අතර රු.මි.8.9 ක් වැය කරන ලදී.

❖ **සිල්මාතා සංවිධාන**

සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේ සමස්ත ලංකා ජාතික මණ්ඩල රැස්වීම් 03ක් හා දිස්ත්‍රික් සිල්මාතා මණ්ඩල රැස්වීම් 54ක් පවත්වන ලදි. 2025 වසරේ සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වියදම් කරන ලද මුදල රු.මි 2.6කි.

❖ **නිකාය මූලස්ථානයේ පරිපාලන පිරිවැය**

නිකාය මූලස්ථාන කාර්යාල පවත්වාගෙන යාම සඳහා ඒ ඒ නිකාය යටතේ පාලනය වන විහාරස්ථාන ප්‍රමාණය සැලකිල්ලට ගෙන කාර්යාල සඳහා දීමනාවක් ලබාදීම සිදු කරනු ලැබේ. මේ යටතේ කාර්යාල සේවකයන් හා රියදුරු දීමනාවක් ලෙස මසකට රු. 20,000.00 බැගින් වසරකට 240,000.00 ක්නිකායන්/නිකාය පාර්ශවයන් 05 ක් වෙනුවෙන් ලබාදෙන ලදී. මේ සඳහා රු. මි 1.2 ක ප්‍රතිපාදන වෙන් වූ අතර වියදම් කරන ලද මුදල රු.මි.1.2 කි.



❖ **නිදහස් දින උත්සවය**

2025 වසරේ ජාතික නිදහස් දිනයට සමගාමීව බෞද්ධ ආගමික වැඩසටහන් හුණුපිටිය ගංගාරාම විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලද අතර, පෙබරවාරි 02 වන දින රාත්‍රී පිරිත් පිංකම නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ දී පවත්වා පසු දින සංඝගත දක්ෂිණාව හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී පවත්වන ලදී. බෞද්ධාගමික වතාවත් ජාතික නිදහස් දින පෙරවරුවේ පෙබරවාරි 04 වන දින උදෑසන කොල්ලුපිටිය ශ්‍රී ධර්මකීර්ත්‍යාරාම පිරිවෙන් විහාරස්ථානය මූලික කර ගනිමින් පවත්වන ලදී. 2025 නිදහස් දින උත්සවය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි 1.7 කි.

❖ **සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනවල මෙහෙයුම් කටයුතු**

ගෞරවනීය මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා මත මෙම දෙපාර්තමේන්තුව මගින් මුලටියන, ඊරියවැටිය සහ අනුරාධපුර යන ප්‍රදේශ වල සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන 03ක් පවත්වාගෙන යනු ලබයි. එම ආයතන මගින් ධර්ම සන්නිවේදන කුසලතා සංවර්ධනය, ශාසනික කාර්යය හා ආරාම වත්පිළිවෙත්, ශිෂ්‍යා සිල්මෑණියන් වහන්සේලා හා ආරාම පරිපාලනය, සිල්මෑණියන් වහන්සේලා සඳහා බලපාන නෛතික ගැටලු, සමාජ අභියෝග, සමාජ සාරධර්ම වර්ධනයට සිල්මෑණියන් වහන්සේලාගේ දායකත්වය සහ භාෂා දැනුම ඉහළ නැංවීමේ අරමුණින් වර්ෂය පුරා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.මෙම ආයතන තුනෙහි ජලය,විදුලිය,සේවක වැටුප් හා වෙනත් දීමනා,ආරක්ෂක සේවා ගෙවීම් සහ සිව්පස යන මෙහෙයුම් වියදම් සඳහා මෙම වර්ෂයේ රු.මි.5.4 ක වියදමක් දරා ඇති අතර මේ වෙනුවෙන් 2025 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන රු.මි 06 කි.

❖ **බෞද්ධ භික්ෂූන් වහන්සේලා පුහුණු කිරිම**

සුපිළිපන් සහ පරපුරක් ගොඩනැගීම අරමුණු කර ගනිමින් නවක සාමනේර හා උපසම්පදා භික්ෂූන් වහන්සේලාට ධර්ම විනය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීම සඳහා කුසලස්ස උපසම්පදා නමින් වන ජාතික වැඩසටහනක් මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. නේවාසිකව පවත්වනු ලබන මෙම පුහුණු වැඩසටහන් සඳහා විද්වත් ස්වාමීන් වහන්සේලා විසින් පවත්වනු ලබන දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුලත් වේ. වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි 3ක් වන අතර ඒ අනුව 2025 වසර තුල වැඩසටහන් 07ක් පවත්වා ඇත.

අනු අංකය	පවත්වන ලද ස්ථානය	සහාභාගී වූ සංඛ්‍යාව	පුහුණුලාභීන්
01	ගලෙන්බිඳුනුවැව ප්‍රා. ලේ.කා.	80	සාමණේර ස්වාමීන් වහන්සේලා
02	තිහගොඩ ප්‍රා. ලේ.කා.	100	සාමණේර ස්වාමීන් වහන්සේලා
03	හාරිස්පත්තුව ප්‍රා. ලේ.කා.	88	සාමණේර ස්වාමීන් වහන්සේලා
04	ලුණුගම්වෙහෙර ප්‍රා. ලේ.කා.	77	සාමණේර ස්වාමීන් වහන්සේලා
05	මාතර කඩවත්සතර ප්‍රා. ලේ.කා.	113	සාමණේර ස්වාමීන් වහන්සේලා
06	ගාල්ල දි. ලේ.කා.	42	විහාරාධිපති ස්වාමීන් වහන්සේලා
07	මාතර දි. ලේ.කා	188	විහාරාධිපති ස්වාමීන් වහන්සේලා

❖ **සිල්මාතා පුහුණුව**

බුදු දහම පිළිබඳ ශ්‍රද්ධාවෙන් යුතුව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ විවිධ පළාත් වල වැඩවාසය කරන්නා වූ 3,000 කට ආසන්න සිල් මෑණියන් වහන්සේලාගේ ධර්ම විනය පිළිබඳ දැනුම හා ශාස්ත්‍රීය ඥානය නිවැරදි ආකාරයෙන් තවදුරටත් වර්ධනය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. ඒ අනුව ධර්ම සන්නිවේදන කුසලතා සංවර්ධනය, ශාසනික කාර්යය හා ආරාම වත්පිළිවෙත්, ශිෂ්‍යා සිල්මෑණියන් වහන්සේලා හා ආරාම පරිපාලනය, සිල්මෑණියන් වහන්සේලා සඳහා බලපාන නෛතික ගැටළු, සමාජ අභියෝග, සමාජ සාරධර්ම වර්ධනයට සිල්මෑණියන් වහන්සේලාගේ දායකත්වය සහ භාෂා දැනුම ඉහළ නැංවීම යන අරමුණු ඇතිව වැඩසටහන් 06ක් කැලණිය හා අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනවල දී පවත්වන ලදී.

මීට අමතරව මුලටියන සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ දී ධර්ම විනය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සඳහා සිල්මෑණියන් වහන්සේලා 21 නමකගේ සහභාගීත්වයෙන් එක් අවුරුදු පුහුණු

පාඨමාලාවක් පවත්වා සාර්ථකව අවසන් කරන ලදී. මේ සඳහා 2025 වර්ෂය වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදනය රු.මි 3.5කි.

අනු අංකය	පවත්වන ලද ස්ථානය	සහාභාගී වූ සංඛ්‍යාව	පුහුණුලාභීන්
01	කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය	30	බදුල්ල දිස්ත්‍රික් සිල් මෑණියන් වහන්සේලා
02	කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය	37	ගම්පහ දිස්ත්‍රික් සිල් මෑණියන් වහන්සේලා
03	කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය	35	කොළඹ දිස්ත්‍රික් සිල් මෑණියන් වහන්සේලා
04	කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය	47	පොලොන්නරුව දිස්ත්‍රික් සිල් මෑණියන් වහන්සේලා
05	අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය	45	අනුරාධපුර දිස්ත්‍රික් සිල් මෑණියන් වහන්සේලා
06	අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය	55	මහනුවර දිස්ත්‍රික් සිල් මෑණියන් වහන්සේලා

❖ **රාජ්‍ය පොසොන් උත්සවය**

මේ සඳහා වෙන් වූ රු. මි. 5 ක ප්‍රතිපාදන අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දුන් අතර ඒවා මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් මගින් රාජ්‍ය පොසොන් උත්සවය පැවැත්වීම වෙනුවෙන් මිහින්තලේ රජ මහා විහාරස්ථානය වෙත නිදහස් කරන ලදී.

❖ **උපසම්පදා උත්සව**

ශාසනයේ චිර පැවැත්ම උදෙසා සුපේශල ශික්ෂාකාමී ස්වාමීන් වහන්සේලා සිටීම අත්‍යාවශ්‍ය කරුණකි. මේ යටතේ සියලුම නිකාය පාර්ශව සංවිධානත්වයෙන් පැවැත්වෙන උපසම්පදා උත්සව වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ලබාදීම යටතේ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් රුපියල් 3,000.00 බැගින් සියලුම නවක උපසම්පදාලාභී ස්වාමීන් වහන්සේලාගේ ගමන් වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලැබේ. මේ යටතේ 2025 වර්ෂයේ නවක උපසම්පදාලාභී ස්වාමීන් වහන්සේලා 841 ක් වෙනුවෙන් රු.මි. 2.52ක් වැය කරන ලද අතර පහත වගුවේ සංඛ්‍යා පරිදි ප්‍රතිපාදන ලබා දී ඇත. මේ සඳහා 2025 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනය රු.මි 3.2කි.

1	ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය	345
2	ස්‍යාමෝපාලි මහ නිකායේ ඌවස්‍යාම වංශික පාර්ශ්වය	8
3	අමරපුර සිරි සද්ධම්මවංශ පාර්ශ්වය	37
4	අමරපුර මූලවංශික පාර්ශ්වය	23
5	ස්‍යාමෝපාලි මහ නිකායේ අස්ගිරි/ මල්වතු පාර්ශව	400
6	ස්‍යාමෝපාලි වංශික මහා නිකායේශ්‍රී රෝහණ පාර්ශ්වය	40
7	සබරගමු අමරපුර සාමග්‍රී මහා සංඝ සභාව	24
8	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව	55

❖ **ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම**

මේ යටතේ සමස්ත ලංකා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල නිලවරණ පැවැත්වීම, විධායක සභා රැස්වීම් පැවැත්වීම සහ දිවයින පුරා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා සඳහා ලිපිද්‍රව්‍ය හා ගමන් වියදම් ගෙවීම සිදු කරනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂය සඳහා රු.මි10ක් වෙන් වූ අතර රැස්වීම්, ගමන් වියදම්, ප්‍රත්‍ය පහසුකම්, ලිපි ද්‍රව්‍ය හා තැපැල් වියදම් වෙනුවෙන් රු.මි. 7.10 ක් වියදම් දරා ඇත.

❖ **ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයීම**

අලුතින් ස්ථාපනය කරන ලද ශාසනාරක්ෂක මණ්ඩල වලට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නව පරිගණක ලබාදීම සිදු කරන ලද අතර ඒ සඳහා රු. මි. 1.47 ක් වැය කර ඇත. මේ සඳහා 2025 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනය රු.මි 1.5කි.

❖ **ආදාහන පූජෝත්සව**

මෙම දෙපාර්තමේන්තුව මගින් අපවත් වී වදාළ මහානායක ස්වාමීන්වහන්සේලාගේ ආදාහන පූජෝත්සව පූර්ණ රාජ්‍ය ගෞරව සහිතවද, ප්‍රධාන පෙළේ නායක ස්වාමීන් වහන්සේලා සඳහා රාජ්‍ය අනුග්‍රහ සහිතවද, ප්‍රාදේශීය භික්ෂූන් වහන්සේලා සඳහා ප්‍රතිපාදන ලබා දීමෙන්ද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආදාහන පූජෝත්සව සඳහා අනුග්‍රහය දැක්වීම සහ සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.ඒ අනුව 2025 වර්ෂයේ ආදාහන උත්සව සඳහා රු.මි 10ක ප්‍රතිපාදන වෙන් වූ අතර, ආදාහන උත්සව අනුග්‍රහය දැක්වීම පහත පරිදි සිදු කර ඇත.

මාසය	ආදාහන පූජෝත්සව ගණන	ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)
ජනවාරි	29	337,500.00
පෙබරවාරි	20	245,000.00
මාර්තු	21	230,000.00
අප්‍රේල්	33	355,000.00
මැයි	24	120,000.00
ජූනි	23	350,000.00
ජූලි	27	385,000.00
අගෝස්තු	15	142,500.00
සැප්තැම්බර්	26	290,000.00
ඔක්තෝම්බර්	30	347,500.00
නොවැම්බර්	25	237,500.00
දෙසැම්බර්	44	260,000.00
එකතුව	317	3,300,000.00

❖ **බෞද්ධ විශ්වකෝෂය මුද්‍රණය කිරීම**

බෞද්ධ විශ්වකෝෂය යනු බුදු දහමට අදාළ සියලු විෂයන්ගේ ප්‍රධාන සංකල්ප විවරණය කරන මූලික බෞද්ධ කෝෂ ග්‍රන්ථයයි. ඒ අනුව ථෙරවාදී, මහායාන හා වජ්‍රයාන යන සියලු බෞද්ධ සම්ප්‍රදායන්ට අයත් බෞද්ධ දාර්ශනික හා සංස්කෘතික වටිනාකමකින් යුතු පුද්ගල, ග්‍රන්ථ, සංකල්ප මෙන්ම, පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන ආදී සියල්ල පැහැදිලි කරමින් ලිපි රචනා කර ඇතුළත් කිරීම මෙම ග්‍රන්ථයේ සම්පාදන ක්‍රියාවලියයි. එය කාලානුරූපී ව යාවත්කාලීන කළයුතු ලෝකයේ බුදු දහම සංවර්ධනය වීමට සමගාමීව අඛණ්ඩව සංවර්ධනය වියයුතු කෘතියකි. මෙහි මූලික අරමුණ වන්නේ බුදු දහමට අදාළ අධ්‍යයනයක හෝ පර්යේෂණයක නිරත වන ලෝකයේ ඕනෑම විද්‍යාර්ථයෙකුට අවශ්‍ය මූලික කරුණු පිළිබඳ අවබෝධයක් ලබා දීමයි.

මේ හැරුණු විට බුදු දහම පිළිබඳ උනන්දුවක් දක්වන විද්වතෙකුට බුදු දහමේ දැක්වෙන ඕනෑම සංකල්පයක් පිළිබඳමනා අවබෝධයක් ලබා ගැනීමට මෙම ග්‍රන්ථය ඉවහල් වේ.
දැනට වෙළුම් ග්‍රන්ථ 08 ක් සම්පූර්ණ කර ඇති අතර එම ග්‍රන්ථ සඳහා සූචි වෙළුම සකස් කිරිමේ කාර්යය මේ වන විට අවසන් කර ඇත. එය ග්‍රන්ථයක් වශයෙන් මුද්‍රණය කිරීමේ කාර්යය ඉතිරිව තිබේ.

2023.12.13 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.0 ඡේදයෙහි සඳහන් (3.3) අනුව "තෝරා ගනු ලබන බෞද්ධ විශ්ව විද්‍යාලයක අනුග්‍රහය මත බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණයෙන් මෙහි ඉදිරි කටයුතු වන ලිපි යාවත්කාලීන

කිරීම, මුද්‍රණය කිරීම, මුද්‍රණයෙන් පසු සෝදුපත් කියවීම, සංශෝධන සිදු කිරීම, ග්‍රන්ථ ලෙස සම්පාදනය කිරීම හා අන්තර් ජාලයට මුදා හැරීම යන කාර්යයන් දෙස් විදෙස් බුද්ධිමතුන්ගෙන් සැදුම් ලත් උපදේශක කමිටුවක උපදෙස් යටතේ සිදු කිරීමට" අනුමත කර ඇත.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය වෙතින් මෙම කාර්යය සිදු කිරීම සඳහා වියදම් ඇස්තමේන්තුවක් ලබා ගත් නමුත්, එම ඇස්තමේන්තුව අධික වූ බැවින් අපේක්ෂා කළ පරිදි 2025 වසර තුල මෙම කාර්යය සිදු කල නොහැකි වූ අතර, අමාත්‍ය මණ්ඩල තීරණය මත වෙනත් විශ්ව විද්‍යාල වෙතින් මිල ගණන් කැඳවීමට තීරණය කර ඇත. 2025 වර්ෂය සඳහා මේ වෙනුවෙන් රු.මි5ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි.

❖ **දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම**

රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව ඌන සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය සඳහා දහම් පාසල් ගොඩනැගිලි හා උපකරණ ආධාර ලබාදීම වාර්ෂිකව සිදු කෙරේ. ඒ අනුව 2025 වර්ෂය සඳහා රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා රු.මි.6.45 ක් සහ අනෙකුත් දිස්ත්‍රික්කවල තෝරාගත් දහම් පාසල් සඳහා ගොඩනැගිලි ආධාර හා උපකරණ ලබාදීම වෙනුවෙන් රු.මි.43.35 ක් ලෙස එකතුව රු.මි.49.8 ක් වැය කර ඇත. මේ සඳහා වෙන් වූ ප්‍රතිපාදනය රු.මි 50.5 කි. එහි සාරාංශය පහත දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	ගොඩනැගිලි ඉදිකිරීම්	උපකරණ ලබාදීම	ප්‍රතිපාදන (රු.මි.)
1	නුවරඑළිය	10	29	6.45
2	කොළඹ	1	4	0.70
3	ගම්පහ	5	3	1.40
4	කළුතර	2	2	0.90
5	ගාල්ල	4	31	4.30
6	මාතර	1	55	5.30
7	හම්බන්තොට	1	1	0.50
8	මහනුවර	2	19	2.04
9	මාතලේ	2	17	2.05
10	රත්නපුර	2	10	1.10
11	කෑගල්ල	3	18	2.50
12	බදුල්ල	3	10	1.90
13	මොනරාගල	3	2	0.80
14	කුරුණෑගල	1	63	6.46
15	අනුරාධපුර	4	23	3.35
16	පොළොන්නරුව	2	18	2.47
17	අම්පාර	1	27	2.89
18	ත්‍රිකුණාමලය	0	30	2.90
19	පුත්තලම	2	10	1.80
එකතුව		49	372	49.8

❖ **සිල්මාතා ආයතන සංවර්ධනය**

සිල්මෑණියන් වහන්සේලාගේ ශාසනික හා අධ්‍යාත්මික සංවර්ධනය මූලික කරගෙන මෙම දෙපාර්තමේන්තුව යටතේ සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය තුනක් පවත්වාගෙන යනු ලැබේ.ඒ අනුව එම ආයතන මගින් අංශ කිහිපයක් යටතේ සිල්මෑණියන් වහන්සේලා වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරයි. අනුරාධපුර අරිප්පු පාර පිහිටි නව සංඝමිත්තාරාම සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය මගින් සිල්මෑණියන් වහන්සේලාගේ ධර්ම ඥානය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ත්‍රිපිටක ධර්මය හැදෑරීමේ පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. කැලණිය, ඊරියවැටිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය යටතේ භාෂා ඥානය වර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රාචීන භාෂා හා ඉංග්‍රීසි, දෙමළ, චීන ඇතුළු

භාෂා පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. මුලටියන පියදාස රත්නායක සිල්මාතා පුහුණු පුහුණු අභ්‍යාස ආයතනය මගින් සිල්මෑණියන් වහන්සේලාගේ ශාසනික වත්පිළිවෙත් පිළිබඳ මූලික පාඨමාලාව හා සද්ධම්මවේදිනි දිගු කාලින පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව සිල්මාතා ආයතන සංවර්ධනය කටයුතු සඳහා 2025 අයවැය මගින් රුපියල් මිලියන 20 වෙන් කර තිබුණු අතර,එම ප්‍රතිපාදන වලින් අනුරාධපුර නව සංඝමිතාරාම සිල්මාතා පුහුණු ආයතනයල මුලටියන පියදාස රත්නායක සිල්මාතා පුහුණු ආයතනය හා කැලණිය, ඊරියවැටිය සිල්මාතා පුහුණු ආයතනය යන පරිශ්‍ර වල ඉදි කිරීම් සහ පිළිසකර කිරීම් වෙනුවෙන් රු.මි. 12.06 ක ප්‍රතිපාදන වැය කර ඇත. මේ වෙනුවෙන් 2025 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනය රු.මි 20 කි.

01.5.6.4 සංවර්ධන අංශයේ 2025 වර්ෂයේ ලියාපදිංචි කිරීම්

- සිල්මාතා ආරාම ගණන - 13
- විහාරස්ථ දායක සභා ගණන - 105
- ආරාම දායක සභා ගණන - 05
- සිල්මෑණියන් වහන්සේලා ගණන - 276
- උපැවිදි වූ (සිල්මෑණියන් වහන්සේලා) ගණන - 45

01.5.6.5 සංවර්ධන අංශයේ 2025.12.31 දිනට කාර්ය මණ්ඩලය

සේවා මට්ටම	සේවය කරන නිලධාරින් සංඛ්‍යාව
කොමසාරිස්	01
සංවර්ධන නිලධාරි	13
කළමනාකරණ සේවා නිලධාරි	-
කාර්යාල කාර්ය සහායක	02
එකතුව	16

01.5.7 දහම් පාසල් අංශය

01.5.7.1 දහම්පාසල් අංශය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දැනුම කේන්ද්‍ර කර ගත් පාසල් අධ්‍යාපනය අතර සාරධර්ම කේන්ද්‍ර කර ගත් දහම් අධ්‍යාපනය ලබා දෙනු ලබන්නේ දහම් පාසලයි. ගාල්ල වැලිවත්ත විජයානන්ද දහම් පාසල සංවිධානාත්මකව 1895 දී ආරම්භ කරන ලද ශ්‍රී ලාංකේය පළමු දහම් පාසල වන අතර, අද වන විට වසර 130ක් සපුරමින් ලංකාව පුරා දිස්ත්‍රික්ක 23 ක දහම් පාසල් 10,810 ක් ලියාපදිංචි වී ඇත. එම දහම් පාසල් අතරින් 10,236 ක් මේ වන විට ක්‍රියාත්මකව පවතී. එහි ගුරුභවතුන් 122,163 ක් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1,647,585 කින්ද සමන්විත වන පරිදි බෞද්ධ දහම් අධ්‍යාපනය පද්ධතිය ක්‍රියාත්මකව පවතී.

01.5.7.2 දහම් පාසල් අංශයේ ඉදිරි දැක්ම

“සාරධර්ම හා නිපුණතාවලින් සපිරි සදාචාරසම්පන්න පුද්ගලයකු ජාතියට දායාද කිරීම”

01.5.7.3 දහම් පාසල් අංශයේ කාර්යභාරයන්

දහම් පාසල් අංශයේ කර්යභාරය ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

1. දහම් පාසල් ශිෂ්‍ය සංවර්ධනය
2. දහම් පාසල් ගුරුභවතුන් සංවර්ධනය
3. දහම් පාසල් කළමනාකරණය හා සංවර්ධනය
4. වෙනත් වැඩසටහන්

01. දහම් පාසල් ශිෂ්‍ය සංවර්ධනය

I. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය හා බෙදා හැරීම
II. දහම් පාසල් 6 - 10 ශ්‍රේණි විභාගය පැවැත්වීම
III. ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් සිසු නිපුණතා වැඩසටහන පැවැත්වීම
IV. දහම් පාසල් අවසාන විභාගය හා ධර්මාචාර්ය විභාගය පැවැත්වීම
V. අන්තර් ආගමික සහජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

02. දහම් පාසල් ගුරුභවතුන් සංවර්ධනය

I. දහම් පාසල් ගුරුදීමනා ලබා දීම
II. දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම් ලබා දීම
III. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය පැවැත්වීම
IV. දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම
V. දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම
VI. සමාදාන විනිශ්චයකාර පදවි ප්‍රදානය කිරීම (කාලීන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වේ.)

03. දහම් පාසල් කළමනාකරණය හා සංවර්ධනය

I. ගුරු සිසු තොරතුරු රැස් කිරීම
II. දහම් පාසල් දින සැමරුම පැවැත්වීම
III. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සකස් කිරීම
IV. දහම් පාසල් ලියාපදිංචි කිරීම

04. වෙනත් වැඩසටහන්

I. ත්‍රිපිටකය සරල සිංහලට පරිවර්තනය කිරීම
II. බුද්ධ ජයන්ති පොත්හල පවත්වාගෙන යාම
III. දහම් පාසල් වෙබ් අඩවිය(Website) සහ දහම් පාසල් (App) යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම

01.5.7.4 දහම් පාසල් අංශයේ කාර්ය සාධක දර්ශක

i.වාර්ෂික අයවැය ඇස්තමේන්තුව
ii.ක්‍රියාකාරී සැලැස්ම
iii.ප්‍රගති වාර්තා
iv.ප්‍රගති සමාලෝචනය

01.5.7.5 දහම්පාසල් අංශය සඳහා 2025 වසරට වෙන් වූ ප්‍රතිපාදන සහ 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය - රු.මි. 1052.9			
එක් එක් වැය විෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය සහ 2025.12.31 දිනට ප්‍රගතිය			
අනු අංකය	වැය විෂය/ වැය ශීර්ෂය	වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	2025.12.31 දිනට ප්‍රගතිය (රු.මි.)
01.	දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම (201-2-2-001-1501)	156	135.713
02.	දහම් පාසල් විභාග පැවැත්වීම (201-2-2-005-1508)	38.7	17.821
03.	සමස්ත ලංකා දහම් පාසල් තරඟය (201-2-2-006-1508)	75	45.894

04.	දහම් පාසල් ගුරුවරුන් සඳහා පහසුකම් සැලසීම (201-2-2-015-1501)	750	616.691
05.	දහම් පාසල් ගුරුභවතුන්ගේ සහතිකපත්‍ර විභාගය (201-2-2-000-1409(13)	3.8	1.798
06.	දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව (201-2-2-11-2202(31)	10	8.673
07.	දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන (201-2-2-11-2202(31)		
08.	ත්‍රිපිටකයේ ප්‍රකාශන (201-2-2-000-1409(011)	15	7.674
09.	දහම් පාසල් ගුරුශිෂ්‍ය ලේඛන 2025(201-2-2-000-1409(7)	0.2	0.2
10.	සමස්ත ලංකා දහම් පාසල් දිනය (201-2-2-000-1409)(7)	1	1
11.	දහම් පාසල් ගුරු හැඳුනුම්පත් (201-2-2-000-1409)(7)	0.2	0.2
12.	අන්තර් ආගමික සහජීවන වැඩසටහන (201-2-2-000-1409(7)	3	1.187
	එකතුව	1052.9	836.851

01.5.7.6 දහම්පාසල් අංශයේ 2025 වර්ෂයේ සියලුම වැඩසටහන්වල ප්‍රගතිය

❖ **දහම් පාසල් ශිෂ්‍ය සංවර්ධනය**

1.දහම් පාසල් පෙළ පොත් බෙදා දීම

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යාවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් දහම් පාසල් පෙළ පොත් සංස්කරණය, මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම දහම් පාසල් අංශය මඟින් සිදු කරනු ලබයි. රජයේ මුද්‍රණාලය විසින් මුද්‍රණය කරනු ලබන පෙළ පොත් වේයන්ගොඩ පිහිටි බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ පොත් ගබඩාව හරහා ශාසනාරක්ෂක මණ්ඩල වෙත බෙදා හරිනු ලැබේ.

2026 වර්ෂයට අදාළ පෙළ පොත් මිලියන 1.34 ක් මුද්‍රණය කිරීමට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදි. මෙම වසරේ දහම් පාසල් පෙළ පොත් වැය විෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 156 කි. 2025.12.31 දින වන විට මාතලේ, නුවරඑළිය, හම්බන්තොට, වව්නියාව, මුලතිව්, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මොණරාගල යන දිස්ත්‍රික්ක 10 සඳහා පෙළපොත් බෙදා අවසන් කර ඇත. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 135.713 ක් වේ.

පෙළ පොත් බෙදා හරිනු ලබන දිස්ත්‍රික්ක සංඛ්‍යාව	- 23
ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල	- 330
ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව	- 1,647,585
ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව	- 10,810

2.දහම් පාසල් 06 - 10 ශ්‍රේණි විභාගය - 2025

ශ්‍රී ලංකාව පුරා සියලුම දහම් පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීමේ සහ ඔවුන් ඇගයීමේ අරමුණින් සෑම වසරකම දහම් පාසල් 6 – 10 ශ්‍රේණි විභාගය පවත්වනු ලබයි. මෙම වසරේ දහම් පාසල් 6 – 10 ශ්‍රේණි විභාගය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 38.7 කි. 2025 වර්ෂයේ 6 - 10 ශ්‍රේණි විභාගය 2025 දෙසැම්බර් මස 14 වන දින පැවැත්වීමට නියමිතව තිබුණද රටේ උද්ගත වූ ආපදා තත්ත්වය හේතුවෙන් එම විභාගය නොපැවැත්වුණි. මෙම විභාගය 2026 වර්ෂයේ ජනවාරි මසදී පැවැත්වීමට නියමිතව ඇත. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 17.821 ක් වේ.

6 - 10 ශ්‍රේණි විභාගය - 2025

විභාගය පැවැත්වෙන දිස්ත්‍රික්ක සංඛ්‍යාව	- 23
ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව	- 10,810
විභාග මධ්‍යස්ථාන සංඛ්‍යාව (අපේක්ෂිත)	- 3,420
විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් දළ වශයෙන්	- 690,554

3.සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන

දහම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත් බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම සඳහාත් නැණ ගුණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන දහම් පාසල් සිසු නිපුණතා වැඩසටහන දහම් පාසල්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් අදියර හතරක් යටතේ පවත්වනු ලැබේ. මෙම වසරේ සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 75 කි.

2025 වසරේ සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන දිස්ත්‍රික්ක 23 ක ශාසනාරක්ෂක මණ්ඩල 329 ක් ආවරණය වන පරිදි දහම් පාසල් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් පවත්වා අවසන් කර ඇත. 2025 දෙසැම්බර් මස 25,26,27 යන දිනයන්හිදි හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමස්ත ලංකා ඇගයීම් අවසන් වැඩසටහන පැවැත්වීමට නියමිතව තිබූ අතර රටේ උද්ගත වූ ආපදා තත්ත්වය හේතුවෙන් එම වැඩසටහන නොපැවැත්වූ අතර මෙම වැඩසටහන 2026 වර්ෂයේදී පැවැත්වීමට නියමිතව ඇත. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 45.894 ක් වේ.

දහම් පාසල් මට්ටමින් ප්‍රදේශීය මට්ටමට තේරී පත්වන ලද සිසුන්	- 419,676
ප්‍රාදේශීය මට්ටමින් දිස්ත්‍රික් මට්ටමට තේරී පත්වන ලද සිසුන්	- 13, 489
දිස්ත්‍රික් මට්ටමින් සමස්ත ලංකා ඇගයීම් මට්ටමට තේරී පත්වන ලද සිසුන්	- 943
සමස්ත ලංකා ඇගයීමෙන් ප්‍රථම ස්ථානයට තේරී පත් වන සිසුන්	- 41

4.අන්තර් ආගමික සහජීවන වැඩසටහන

පන්සල, පල්ලිය, කෝවිල, ඉස්ලාම් පල්ලිය නියෝජනය කරනු ලබන ගරු ස්වාමීන් වහන්සේලා සහ පූජා පූජක ප්‍රසාදීන් සම්බන්ධ කර ගනිමින් එක් එක් ආගමික ශාස්තෘවරුන් විසින් වදාරා ඇති ධර්ම කරුණු සරලව පැහැදිලි කර දෙමින් එම ආගම් වල පවත්වනු ලබන පූජා පිළිවෙත් දහම් පාසල් දරුවන්ට දැක බලා ගැනීමටත් අනෙකුත් ආගම් පිළිබඳව අවබෝධයක් ලබාදීමටත් සර්ව ආගමික සිද්ධස්ථාන නැරඹීමට අවස්ථාව ලබාදීමත් මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලබයි.

සෑම ආගමක මුඛ්‍ය අරමුණ සමස්ත මිනිස් වර්ගයාගේ යහපත සැලසීම බව ප්‍රකාශ කිරීම හා සියලුම ආගමිකයින් අතර අන්‍යොන්‍ය විශ්වාසය හා සහයෝගය වර්ධනය කරමින් දහම් පාසල් දරුවන් හරහා සමාජය තුළ සහජීවනය ඇති කරලීම මෙවැනි වැඩසටහන් පැවැත්වීමේ මූලික අරමුණ වේ.

මෙම වසරේ අන්තර් ආගමික සහජීවන වැඩසටහන පැවැත්වීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 3 කි. මෙම වැඩසටහන කළුතර දිස්ත්‍රික්යේ බෝම්බුවල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ දී 2025.11.21,22 සහ 23 යන දිනයන්හිදි පවත් වන ලදි. එහිදි බෞද්ධ, කතෝලික, හින්දු සහ ඉස්ලාම් යන සර්ව ආගම් නියෝජනය කරමින් දහම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 80 ක් සහභාගී විය. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1.187ක් වේ.

❖ **දහම් පාසල් ගුරුභවතුන් සංවර්ධනය කිරීම**

1.දහම් පාසල් ගුරුභවතුන් සඳහා දීමනා ලබා දීම

නිස්සරණධ්‍යාසයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු වන ගුරුභවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගය කරනු වස් දහම් පාසල් ගුරු සේවයේ වසර තුනක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද සහ එක් වසරක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් සඳහා ගුරු දීමනාව සහ නිල ඇඳුම් දීමනාව ප්‍රදානය කිරීම 2025 වර්ෂයේ දී සිදු කරන ලදි.
එම දීමනාව වාර්ෂිකව ගුරුභවතුන් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන අනුව තීරණය වේ. මේ යටත් 2006 වසරේ සිට රුපියල් 2000/- බැගින් ද 2017 වර්ෂයේ සිට එම දීමනාව රුපියල් 5000/- බැගින් ද ගෙවීම සිදු කරනු ලබයි. 2025 වර්ෂයේ දී වසර තුනක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කළ ගුරුභවතුන් සඳහා ගුරුදීමනාව හා නිල ඇඳුම් දීමනාව වශයෙන් රු.7,500/- බැගින් ද එක් වසරක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් සඳහා ගුරුදීමනාව වශයෙන් රු.5,000/- බැගින් ද ගෙවීම් කරන ලදි. මෙම වසරේ දහම් පාසල් ගුරුභවතුන් සඳහා දීමනා ලබා දීමට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 750 කි.

ඒ අනුව වසර 3 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් 68,894 ක් සඳහා ගුරුදීමනාව සහ නිලඇඳුම් දීමනාව ද වසර 1 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් 20,846 ක් සඳහා ගුරුදීමනාව ද වශයෙන් ගුරුභවතුන් 89,740 ක් සඳහා 2025.12.31 දින වන විට දීමනාවන් ප්‍රදානය කර ඇත. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 616.691 ක් වේ. (නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක ගුරු දීමනා අතපසු වීමක් හේතුවෙන් වෙනත් වැය විෂයකින් ගෙවීම් සිදු කර ඇති බවට දන්වා ඇති අතර ඒ අනුව භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය සංඛ්‍යා අතර වෙනස් වීමක් පෙන්නුම් කරයි.)

ගුරු දීමනා ලබාදීම - 2025				
අනු අංකය	දිස්ත්‍රික්කය	වසර 03ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් සංඛ්‍යාව	වසර 01ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් සංඛ්‍යාව	එකතුව
01.	කොළඹ	6104	1624	7,728
02.	ගම්පහ	6055	1731	7,786
03.	කළුතර	4562	1341	5,903
04.	මහනුවර	6363	1642	8005
05.	මාතලේ	2303	667	2,970
06.	නුවරඑළිය	1580	485	2065
07.	ගාල්ල	4540	1421	5,961
08.	මාතර	4198	1267	5,465
09.	හම්බන්තොට	2976	917	3,893
10.	පුත්තලම	1537	608	2,145
11.	කුරුණෑගල	7556	2377	9,933
12.	ත්‍රිකුණාමලය	559	206	765
13.	අම්පාර	1354	391	1,745
14.	වව්නියාව	141	62	203
15.	මුලතිව්	79	27	106
16.	බදුල්ල	3084	982	4,066
17.	මොණරාගල	2260	820	3080
18.	කෑගල්ල	3810	1079	4,889
19.	රත්නපුර	4468	1526	5,994
20.	අනුරාධපුර	3537	1101	4,638
21.	පොළොන්නරුව	1810	563	2,373
22.	මඩකලපුව	18	7	25
23.	මන්නාරම	-	2	2
	එකතුව	68894	20846	89740

2.ගුරු සහතිකපත්‍ර විභාගය

ගුරු සේවයේ නියුතු ගුරුවරුන්ගේ මූලික සුදුසුකම් සපුරාලීම, අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම, ඔවුන්ගේ සේවය අගය කිරීම, ගුරුභවතුන්ගේ දැනුම තවදුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම හරහා ඔවුන්ට සමාජ පිළිගැනීමක් ඇති කරලීම මෙන්ම එමඟින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම යන අරමුණු මූලික කර ගනිමින් ගුරු සහතිකපත්‍ර විභාගය පවත්වනු ලැබේ. මෙම වසරේ ගුරු සහතිකපත්‍ර විභාගය පැවැත්වීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.3.8 කි.

ගුරු සහතිකපත්‍ර විභාගය 2025 ජූනි මස 21 වන දින පවත්වන ලද අතර එම විභාගය සඳහා 3,597 ක් පෙනී සිටින ලදි. එයින් ගුරුභවතුන් 3,144 ක් සමත් වී ඇත. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1.798 ක් වේ.

ගුරු සහතිකපත්‍ර විභාගය - 2025	
විභාගය පවත් වන ලද මධ්‍යස්ථාන සංඛ්‍යාව	- 20
විභාගයට පෙනී සිටි ගුරුභවතුන් සංඛ්‍යාව	- 3,597
සමත් ගුරුභවතුන් සංඛ්‍යාව	- 3,144
සමත් ගුරුභවතුන්ගේ ප්‍රතිශතය	- 87%

3.දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව

දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් 2006 වර්ෂයේ ආරම්භ කරන ලද දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව බෞද්ධ කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ එකතුව පැවැත්විය. 2018 වර්ෂයේ සිට මෙම පාඨමාලාව උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කර 2018/2019 අධ්‍යයන වර්ෂයේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමඟ ද එම පාඨමාලාවේ දෙවන ශිෂ්‍ය කණ්ඩායම ලෙස 2021/2022 අධ්‍යයන වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ ද ක්‍රියාත්මක කරන ලදි.

දිවයින පුරා දිස්ත්‍රික්ක 19 ක දහම් සරසවිය බුද්ධධර්ම උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබන අතර මෙම වැඩසටහන යටතේ මේ වන විට දහම් පාසල් ගුරුභවතුන් 1,0000 කට ආසන්න ප්‍රමාණයක් උසස් ඩිප්ලෝමාධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් බවට පත් කර ඇත. මේ වන විට 2026/2027 අධ්‍යයන වර්ෂයට අදාළ දහම් සරසවිය බුද්ධධර්ම උසස් ඩිප්ලෝමාව පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු විශ්වවිද්‍යාලය තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

4.දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩමුළුව පැවැත්වීම

නිස්සරණාධ්‍යාසයෙන් දහම් පාසල්හි ඉගැන්වීමේ කටයුතුවල නිරත වන ගුරුභවතුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, එම පුහුණු වැඩසටහන් නිශ්චිත ක්‍රමවේදයකට අනුව විධිමත් නියාමනයක් යටතේ සිදු කිරීමේ අවශ්‍යතාවය හා වැදගත්කම පෙනී යන ලදි. මේ සඳහා විධිමත් ගුරු පුහුණු සම්පත්දායකයින්ගෙන් සැදුම්ලත් සංචිතයක් පිහිටුවා ගැනීම උදෙසා විෂයානුබද්ධිත මොඩියුල 05 ක් යටතේ පුහුණු වැඩසටහන් පවත්වා දැනුමෙන් පරිපූර්ණ ගුරු පුහුණු සම්පත්දායක සංචිතයක් පිහිටුවීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.

සම්පත්දායකයක පුහුණු වැඩසටහන - 2025			
අනු අංකය	වැඩසටහන	වැඩසටහන සඳහා සහභාගී වූ දිස්ත්‍රික්ක	පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව
01.	කුරුණෑගල වැඩසටහන	කුරුණෑගල	90
02.	රත්නපුර වැඩසටහන	රත්නපුර, බදුල්ල, මොණරාගල	51

ගුරු පුහුණු වැඩසටහන - 2025			
අනු අංකය	දිස්ත්‍රික්කය	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කරන ලද ගුරුභවතුන් සංඛ්‍යාව
01.	කොළඹ	13	459
02.	ගම්පහ	12	1470
03.	කළුතර	13	1566
04.	මහනුවර	11	1140
05.	මාතලේ	11	1060
06.	නුවරඑළිය	01	102
07.	ගාල්ල	17	1904
08.	මාතර	16	1866
09.	හම්බන්තොට	12	1335
10.	පුත්තලම	14	1311
11.	කුරුණෑගල	23	2554
12.	ත්‍රිකුණාමලය	02	135
13.	අම්පාර	07	649
14.	වව්නියාව	01	51
15.	මුලතිව්	01	100
16.	බදුල්ල	09	1353
17.	මොණරාගල	11	1370
18.	කෑගල්ල	14	1413
19.	රත්නපුර	17	1703

20.	අනුරාධපුර	22	2275
21.	පොළොන්නරුව	07	672
එකතුව		234	24,488

2025 වසරේ දහම් සරසවිය බුද්ධ ධර්ම උසස් ඩිප්ලෝමා පාඨමාලාව සහ දහම් පාසල් ගුරු පුහුණු වැය විෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 10කි. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 8.673 ක් වේ.

❖ දහම් පාසල් කළමනාකරණය හා සංවර්ධනය

1.වාර්ෂික ගුරු සිසු තොරතුරු රැස් කිරීම

දහම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ ගුරුභවතුන්ගේ සංවර්ධනය ඉලක්ක කරමින්, සැලසුම් සකස් කිරීම හා ප්‍රතිපත්තිමය තීරණය ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මෙම වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. 2025 වර්ෂයේ ලබා ගත් තොරතුරු අනුව දිස්ත්‍රික්ක 23 ක ලියාපදිංචි දහම් පාසල් 10,810 ක් වන අතර එයින් ක්‍රියාත්මක දහම් පාසල් සංඛ්‍යාව 10,236 ක් වේ. දහම් පාසල් ගුරුභවතුන් වශයෙන් ස්වාමීන් වහන්සේලා 13,911 ක්ද සිල්මැණියන් වහන්සේලා 548 ක්ද පිරිමි ගුරුභවතුන් 18,594 ක්ද ගැහැණු ගුරුභවතුන් 89,110 ක්ද ඇතුළත්ව මුළු ගුරුභවතුන් සංඛ්‍යාව 122,163 ක් ලියාපදිංචි වී ඇත. ඉහත සඳහන් වන පරිදි ක්‍රියාත්මක දහම් පාසල් යටතේ සිසුන් 1,647,585 ක් දහම් අධ්‍යාපනය ලබයි. ඒ අතර පිරිමි සිසුන් 799,980 ක් ද ගැහැණු සිසුන් 847,605 ක් ද වේ.

ශ්‍රී ලංකාවේ දහම් පාසල් ගුරුභවතුන්ගේ සහභාගීත්වය (2021 – 2025)

වර්ෂය	ගුරුභවතුන් සංඛ්‍යා ව්‍යාප්තිය
2021	133,416
2022	126,090
2023	126,347
2024	123,931
2025	122,163



ශ්‍රී ලංකාවේ දහම් පාසල් ශිෂ්‍ය තොරතුරු (2021 – 2025)

අනු අංකය	වර්ෂය	සිසු සංඛ්‍යා ව්‍යාප්තිය
1	2021	2,287,585
2	2022	2,191,101
3	2023	2,048,460
4	2024	1,816,526
5	2025	1,647,585



2.දහම් පාසල් දින සැමරුම

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ දහම් පාසල වන ගාල්ල වැලිවත්ත, විජයානන්ද දහම් පාසල 1895 අගෝස්තු මස 03 වන දින ආරම්භ කිරීම සමරනු වස් සෑම වර්ෂයකදීම අගෝස්තු 03 වැනි දින ජාතික දහම් පාසල් දින සැමරුම් මහෝත්සවය පැවැත් වේ. වර්තමානය වන විට දිස්ත්‍රික්ක 23 ක් පුරා ලියාපදිංචි දහම් පාසල් 10,810 ක්ව ව්‍යාප්තව තිබෙන දහම් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය ඉගෙනුම ලබන 1,647,585 ක දහම් පාසල් දරුවන්ගෙන් සහ 122,163 ක ගුරුභවතුන් සංඛ්‍යාවෙන් ද පෙන්නුම් කරනු ලබයි.

වාර්ෂික දහම් පාසල් සැමරුම් දින උත්සවය පැවැත්වීම තුළින් දහම් අධ්‍යාපනයේ වැදගත්කම හා අවශ්‍යතාවය සමාජය තුළ ඇති කරලීම සහ දහම් අධ්‍යාපනය පිළිබඳව දරුවන් තුළ උද්යෝගයක් ඇති කරලීම මූලික අරමුණු කරගනු ලබයි.

2025 වසරේ දහම් පාසල් සැමරුම් දින වැඩසටහන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1 කි. සමස්ත ලංකා දහම් පාසල් දින සැමරුම මෙම වසරේ දී අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ දී පවත්වන ලදි. අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක දහම් පාසල් 211 ක ප්‍රධාන ශිෂ්‍ය නායකයින් 422 ක් සඳහා ත්‍යාග පිරි නැමූ අතර අදාළ දහම් පාසල් වෙනුවෙන් ලිපිද්‍රව්‍ය කට්ටලය බැගින් ප්‍රදානය කිරීමද සිදු කරන ලදි. එසේම වැඩි සේවා කාලයක් හිමි ගුරුභවතුන් 62 ක් සඳහා සේවා ඇගයීමේ සමරු ඵලකයක පිරිනමන ලදි. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1 කි.

3.දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සකස් කිරීම

නිස්සරණධ්‍යාසයෙන් දහම් දැනුම ලබා දෙන වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දහම් පාසල් ගුරුභවතුන් සඳහා ගුරු හැඳුනුම්පත් නිකුත් කරනු ලබයි. හැඳුනුම්පත් මුද්‍රණය කිරීම පළමු අදියර යටතේ මුද්‍රිත හැඳුනුම්පත් 530 අදාළ ප්‍රා දේශීය ලේකම් කාර්යාල වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

4.දහම් පාසල් ලියාපදිංචි කිරීම

ගුණ ගරුක සමාජයක් ඇති කිරීමේ අරමුණින් පිහිටුවා ඇති සියලු බෞද්ධ දහම් පාසල්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ දහම් පාසල් අංශය විසින් ලියාපදිංචි කරනු ලබයි. මේ වන විට දිවයින පුරා දහම් පාසල් 10,810 ක් ලියාපදිංචි වී ඇත. එයින් දහම් පාසල් 10,236 ක් මේ වන විට ක්‍රියාත්මකව පවතී. මෙසේ ලියාපදිංචි කර ඇති දහම් පාසල් වල සිසුන් සහ ගුරුභවතුන් සඳහා විවිධ වැඩසටහන්, පාඨමාලා සහ දීමනා ගෙවීම් යනාදි කරුණු විෂයෙහි අවස්ථාවන් ලබා ගැනීමට හැකි වේ.

මෙසේ ලියාපදිංචි සිදු කරන ලද දහම් පාසල් සඳහා දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන වැඩසටහන් හා සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබෙන අතරම පෙළ පොත් ලබාදීම, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට 6 – 10 ශ්‍රේණි විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලැබීම, ගුරු දීමනා ලබා දීම, ගුරුභවතුන්ට ගුරු සහතිකපත්‍ර විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලැබීම, දහම් සරසවිය බුද්ධධර්ම උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබීම, ගුරු පුහුණු වැඩමුළු සඳහා සහභාගී වීමට

අවස්ථාව ලැබීම සහ වෙනත් කාලීනව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා ගැනීමට හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරි දහම් පාසල් සංඛ්‍යාව (2021 – 2025)

අනු අංකය	වර්ෂය	දහම් පාසල් ගණන
1	2021	10,320
2	2022	10,297
3	2023	10,373
4	2024	10,646
5	2025	10,810



❖ **වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

1. **ත්‍රිපිටකය සරල සිංහලට පරිවර්තනය කිරීම**

පාලි භාෂාවෙන් පමණක් පුස්කොළ පොත්වල ලියා තිබු සම්පූර්ණ ත්‍රිපිටක ගත පාලි ධර්මය ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 2500 (ක්‍රි.ව1956) සම්පූර්ණ වීම නිමිත්තෙන් බෞද්ධ ජනතාවගේ ඉල්ලීම පරිදි, ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය මඟින් සිංහල භාෂාවට පරිවර්තනය කර බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නමින් ග්‍රන්ථ 57 ක් ලෙස මුද්‍රණය කර ඇත.

එම පරිවර්තනයන් තව දුරටත් සරල සිංහලට පරිවර්තනය කර පාඨකයන්ට කියවා තේරුම් ගැනීමට පහසු කරවනු වස් වර්ෂ 1993 දී පළමු කී බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සිංහල පරිවර්තනය සරල සිංහල භාෂාවට නැවත ලිවීමට තීරණය කර, මහානායක මහතෙරුන් වහන්සේලාගෙන් සමන්විත සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයක් පිහිටුවා ඇත. එසේ පිහිටු වන ලද මණ්ඩලය මඟින් සම්පාදනය කරන ලද ත්‍රිපිටක ග්‍රන්ථ රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කර ජනතාව අතර ප්‍රචලිත කරනු ලබයි. සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටකයට අයත් පොත් 57 අතුරින් පරිවර්තනය කිරීමට යෝජිත පොත් 55කි. මේ වන විට පොත් 37 ක් ඒකාබද්ධ කර පොත් 30 ක් වශයෙන් වැඩ අවසන් කර ජනගත කර ඇත.

2025 වර්ෂයේ ත්‍රිපිටකය සරල සිංහලට පරිවර්තනය කිරීම සඳහා වැය විෂය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 15කි. අභිධර්ම පිටකයට අයත් අංක 31 හා 32 ග්‍රන්ථ වන සිංහල කථාවත්ථුප්පකරණය 1 - 2 වන ග්‍රන්ථ මුද්‍රණ කටයුතු අවසන් කර ජනගත කිරීමට නියමිතව ඇත. අභිධර්ම පිටකයට අයත් අංක 33 වන ග්‍රන්ථය වන සිංහල කථාවත්ථුප්පකරණය - 3 මුද්‍රණ කටයුතු සඳහා භාර දී ඇත. අංක 34,35,36 යන ග්‍රන්ථ වන සිංහල යමකප්පකරණය 1,2,3 ග්‍රන්ථ මුද්‍රණය කටයුතු සඳහා රජයේ මුද්‍රණාලය වෙත භාර දී ඇත. මෙම වැය විෂය යටතේ වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 7.674 කි.

2. බුද්ධ ජයන්ති පොත් හල

මහජනතාවගේ දහම් දැනුම වර්ධනයට මහත්සේ උපකාරි වන සුවිශේෂි දහම් පොත් රාශියක් මුද්‍රණ පිරිවැය පමණක් අය කර මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ බුද්ධ ජයන්ති පොත්හල ක්‍රියාත්මක කරනු ලබයි. සංක්ෂිප්ත සරල සිංහලට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ හා බෞද්ධ විශ්ව කෝෂ සිංහල හා ඉංග්‍රිසි බසින් රචිත බෞද්ධ විචාර පොත් සහ වෙනත් බෞද්ධ පොත් රාශියක් මෙහි අලෙවිය සඳහා තිබේ.

3. **දහම් පාසල් වෙබ් අඩවිය (www.dbadhammaschool.giize.com) සහ දහම් පාසල් ඇප් (App) යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.**

දහම් පාසල් පද්ධතිය දැනුවත් කිරීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් යොමු කරන ලබන ලිපි, චක්‍ර ලේඛ අවම වියදමකින් හා කඩිනම්ව දහම් පාසල් වෙත යොමු කිරීම මෙමඟින් හැකි වී තිබේ. තවද ගුරු සහතිකපත්‍ර විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම සහ එම විභාගය සඳහා අයදුම්පත් කැඳවීම ද මෙයින් සිදු කරනු ලබයි. එසේම දහම් පාසල් පෙළ පොත්, ගුරු අත්පොත්, ගුරු විභාග සහ සිසු නිපුණතා ප්‍රශ්නපත්‍ර මෙම වෙබ් අඩවියට සහ මෘදුකාංගයට පිවිසීමෙන් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

01.5.7.7 දහම් පාසල් අංශයේ ඉදිරි ඉලක්ක

- ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ යෝජිත වැඩසටහන් විධිමත් ආකාරයෙන් නියමිත කාල වකවානුවට පවත්වා අවසන් කිරීම.
- ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය ලබා ගැනීම සහ පසු විපරම ක්‍රියාවට නැංවීම.

01.5.8 අභ්‍යන්තර විගණන අංශය

01.5.8.1 අභ්‍යන්තර විගණන අංශය පිලිබඳ හැඳින්වීම

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශ වල හා ඊට අනුබද්ධිත ප්‍රාදේශීය කාර්යාල වල, සිල්මාතා පුහුණු මධ්‍යස්ථාන සහ විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන වල (විහාරස්ථාන සහ දේවාල) අවදානම් කළමනාකරණය, යහපාලනය හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීම හා උපදේශාත්මක කාර්යයක් සිදු කිරීම මෙන්ම එම සිද්ධස්ථාන විගණනයට ලක්කිරීම හා එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබාදීම මෙම අංශයෙන් සිදු කෙරේ.

01.5.8.2 අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි මුදල් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් එක් කාර්තුව අවසානයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය හා ගිණුම් වාර්තාවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක වන්නේදැයි සමාලෝචනය හා ඇගයීම.
- වත්කම්, අලාභ වලින් ආරක්ෂා වනු ලබන්නේද පරීක්ෂාව.
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා ආයතනික චක්‍රලේඛ වලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂාව.
- ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වසනීයත්වය නිශ්චය කිරීම, පවතින ගිණුම් ක්‍රමය මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා අවශ්‍ය තොරතුරු සපයන්නේ දැයි සොයා බැලීම.
- නාස්තිය, ඌණ උපයෝජනය, පමණ ඉක්මවා සිදුකරන වියදම් වැලැක්වීමට හා අනාවරණය කර ගැනීමට ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල සාර්ථකභාවය ඇගයීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම, පැවැත්වීම හා වාර්තාකරණය සිදු කිරීම.

- කාර්ය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.
- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පවතින සිද්ධස්ථාන වල විගණන කටයුතු සිදුකිරීම.
- අවශ්‍ය අවස්ථාවල විශේෂ විමර්ශන පැවැත්වීම හා විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීම.
- ප්‍රගති ඇගයීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට සහාය වීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට සහාය වීම.

01.5.8.3 අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධන දර්ශක

- විගණන සැලැස්ම
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම.
- කාර්තුමය ඇගයීම් වාර්තා
- විගණන සාරාංශය

01.5.8.4 අභ්‍යන්තර විගණන අංශයේ ඉදිරි ඉලක්ක

- අභ්‍යන්තර පාලන පද්ධතිවල පවතින දුර්වලතා නිවැරදි කර ශක්තිමත් කිරීමට සහය වීම.
- විහාර දේවාලගම් පනතේ විධිවිධාන අනුව සිද්ධස්ථානයක පවත්වාගෙන යා යුතු ගිණුම් පොත්පත් පිළිබඳ හඳුන්වා දී ඇති පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම.
- විගණන සැලැස්ම අනුව විගණන කටයුතු සිදු කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

01.5.8.5 අභ්‍යන්තර විගණන අංශය විසින් 2025 වර්ෂයේ ඉදිරිපත් කර ඇති විගණන වාර්තා (ප්‍රගතිය)

1. සපරගමුව මහ සමන් දේවාලය - රත්නපුර
2. බැංකු සැසඳුම් පරීක්ෂාව
3. ශ්‍රී සංඛපාල රාජමහා විහාරය
4. රුහුණු මහා කතරගම දේවාලය
5. ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව 2024 අවසාන කාර්තුව
6. මැදගොඩ පත්තිනි දේවාලය
7. ලංකාතිලක ශ්‍රී විෂ්ණු දේවාලය
8. උග්ගල් අලුත්නුවර කතරගම දේවාලය
9. හඟුරනකෙත ශ්‍රී විෂ්ණු දේවාලය
10. අම්මඩුව කුඩා කතරගම දේවාලය
11. වේගිරිය නාථ දේවාලය
12. මොණරවාණ කිර්ති බණ්ඩාර දේවාලය
13. සොරගුණේ කුඩා කතරගම දේවාලය
14. බොල්තුඹේ සමන් දේවාලය
15. විල්බාව පත්තිනි දේවාලය
16. ශ්‍රී දළදා මාලිගාව මහනුවර
17. අත්තිකාරම් බී ගිණුම 2024
18. ශ්‍රී දළදා මාලිගාව මහනුවර (පළමු අර්ධ වර්ෂය 2025)
19. කිරි වෙහෙර රාජමහා විහාරය
20. ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව පළමු කාර්තුව 2025
21. ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව දෙවන කාර්තුව 2025
22. තිස්සමහාරාම රාජමහා විහාරය
23. සෙල්ලකතරගම මහසෙන් විහාරය
24. දොඩම්වල ශ්‍රී නාථ දේවාලය

25. දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලය
26. අම්බොක්ක පත්තිනි දේවාලය
27. මහියංගනය ශ්‍රී සුමන සමන් දේවාලය
28. මුතියංගන රාජමහා විහාරය
29. සංචිත හා නිල වාහන නඩත්තුව, අලුත්වැඩියාව හා කළමනාකරණය පිළිබඳ පරීක්ෂාව
30. ඊරියවැටිය දසසිල්මාතා පුහුණු ආයතනය
31. මහනුවර පත්තිනි දේවාලය
32. ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව තෙවන කාර්තුව 2025
33. මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා අභ්‍යාස ආයතනය

01.5.9 බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය- මහනුවර

මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය, මහියංගණ රජමහා විහාරය, බෝගොඩ රජ මහා විහාරය සහ මහියංගණ සුමන් දේවාලය ඇතුලුව බෞද්ධ විහාර දේවාල ගම් ආඥා පනතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන 72 හා දේවාල 19 ක් ඇතුළු සිද්ධස්ථාන 91 ක් සහ අනෙකුත් සිද්ධස්ථාන 2580 ක ප්‍රමාණයක රාජකාරි කටයුතු ආවරණය කිරිම මෙම කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

තවද ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන විහාරස්ථාන සංවර්ධන කාර්යයන් , දහම් පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා ගුරුභවතුන් සම්බන්ධ කටයුතු මෙන්ම බෞද්ධ සමිති සමාගම් වලට අදාළ කටයුතු ද බෞද්ධ ප්‍රජාවගේ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් විශාල ප්‍රමාණයක් ප්‍රාදේශිය වශයෙන් දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් මහනුවර කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.තවද බෞද්ධ විහාරස්ථාන සතුව පවතින හඳුනානොගත් භූමින් හඳුනාගෙන විධිමත් අයුරින් බදු ලබාදීමටත් බෞද්ධ සිද්ධස්ථාන හා මහජන ප්‍රජාව අතර සුහදතාවය ඇති කරලීමටත් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.අප ප්‍රාදේශිය කාර්යාලය මඟින් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට කටයුතු කරන අතර ඉතා සුහදශිලි මහජන සම්බන්ධතාවයක් ගොඩනගාගෙන යනු ලබයි.

01.5.9.1 මහනුවර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්.

- ශ්‍රී දළදා මාළිගාව, විෂ්ණු, කතරගම, නාථ සහ පත්තිනී යන සතර මහා දේවාල හා පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ සහ බස්නායක නිලමේවරු පත්කිරිමේ ඡන්ද කටයුතු සිදු කිරිම.
- පාලනය වන විහාරස්ථාන සහ දේවාල සඳහා භාරකරුවන් පත්කිරිම.
- භාරකාර ඇප මුදල් තැන්පත් කිරිම සහ නිදහස් කිරිම.
- සිද්ධස්ථාන වල දේපළ භාරකරුවන්ට භාරදීම.
- විහාර දේවාලවලට අයත් ඉඩම් බදු දීම.
- ප්‍රවේණි අයිතිවාසිකම් පවරා ගැනිම පිළිබඳ ලේඛන පවත්වාගෙන යාම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනිම, පරික්ෂා කිරිම
- සිද්ධස්ථාන වල මුදල් නිදහස් කිරිම.
- සිද්ධස්ථාන වලට අදාල බදු ඉඩම් ගැටළු වලදී මැදිහත්කරුවකු ලෙස සක්‍රියව සම්බන්ධ වීම.
- විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදු කිරිම.
- ශ්‍රී දළදා පෙරහැර, උපසම්පදා කටයුතු වලට සහාය වීම.
- දහම් පාසැල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගී වීම හා සහාය විම.
- සෑම සිද්ධස්ථානයකට අදාලව භාණ්ඩ ලේඛණයක් පවත්වාගෙන යාම.
- දළදා මාලිගාව,සතර මහා දේවාල සහ අනේකුත් සිද්ධස්ථාන වල පවතින චාරිත්‍රානුකූලව පවත්වනු ලබන සාම්ප්‍රධායික උත්සව කටයුතු වලට සහභාගී වීම හා සහාය විම.

01.5.9.2 මහනුවර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිරි ඉලක්ක

1. සිද්ධස්ථාන ඉඩම් සම්බන්ධ විස්තර බොහෝ අවස්ථාවල අදාළ සිද්ධස්ථාන භාරකරුවන් සන්තකයේ පමණක් ඇති අතර ඒ සම්බන්ධ විස්තර මෙම කාර්යාලය සතු නොවීම හේතුවෙන් විවිධ ගැටළුකාරී තත්වයන්හිදී දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදු වේ. එයට විසඳුමක් ලෙස මෙම කාර්යාලය මගින් 4(1) යටතේ පාලනය වන සිද්ධස්ථාන ඉඩම්වලට අදාළ කොමසාරිස් පොතේ පිටපත් හා මූලික පිඹුරු පිටපත් ගෙන්වා ගැනීමට වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී. ඒ පිළිබඳව මෙම කාර්යාලයේ විෂය නිලධාරීන් දැනුවත් කර එවැනි ලේඛන පිටපත් නිසි පරිදි පවත්වාගෙන යාමේ වැදගත්කමද අවධාරණය කරන ලදී.

2. සිද්ධස්ථාන භාරකරුවන් හා ඉඩම් බුක්ති විඳින පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට මෙම වසරේදී අපේක්ෂා කෙරේ.

   - සිද්ධස්ථාන ඉඩම් බුක්ති විඳින පුද්ගලයන් විසින් බදු ගෙවීමේදී නියමිත කාලසීමාව තුළ බදු මුදල් නොගෙවීම, නියමකර ඇති වටිනාකමට වඩා අඩුවෙන් ගෙවීම, බදු ගෙවීම පැහැර හැරීම වැනි බදු සම්බන්ධ විවිධ ගැටළු රාශියක් නිරීක්ෂණය වන අතර වර්තමාන ආර්ථික තත්වය මීට හේතු වන බව හඳුනා ගත හැක. එසේ වුවද සිද්ධස්ථාන නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා බදු ආදායම ඉහළ නංවා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව බදු පිළිබඳව ඉඩම් බුක්තිකරුවන්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් බදු ආදායම වැඩි කර ගැනීමට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරන අතර ඒ තුළින් බදු ගෙවීමට ස්වයං අභිප්‍රේරණයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.

   - සිද්ධස්ථානවල භාරකරුවන් වෙනස් වීමේදී බදු දී ඇති ඉඩම් හා බදු ගොණු සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීම දුෂ්කර වීමත්, එවැනි තොරතුරු ඇතුළත් ලේඛන අස්ථානගත වීමත් අවම කර ගැනීම සඳහා 4/1 යටතේ පාලනය වන සිද්ධස්ථාන 91 වෙනුවෙන් එකම අකෘතියට සකස් කරන ලද පරිගණකගත දත්ත පද්ධතියක් හඳුන්වා දීමට මෙම වසරේදී අපේක්ෂා කෙරේ. තවද එයට තොරතුරු ඇතුළත් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම පිළිබඳව භාරකරුවන් හා කාර්යමණ්ඩලය දැනුවත් කිරීමට බලාපොරොත්තු වන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

   - සිද්ධස්ථාන භාරකරුවන් විසින් සම්පූර්ණ විස්තර සහිතව ගණන් තැබිය යුතුය යන්න 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවලගම් ආඥා පනතේ 35 වන වගන්තියේ සඳහන් වේ. ඒ අනුව 4(1) යටතේ පාලනය වන සිද්ධස්ථානවලට අදාළව පවත්වාගත යුතු ලේඛන නිසි පරිදි පවත්වා නොගැනීම සම්බන්ධයෙන් නිරන්තර විගණන විමසුම්වලට ලක් වන බැවින් එලෙස පවත්වාගත යුතු ලේඛන පිළිබඳව සිද්ධස්ථාන භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කෙරේ. නිශ්චල දේපළ පිළිබඳ ලේඛනය, චංචල දේපළ පිළිබඳ ලේඛනය, මුදල් පොත වැනි ලේඛන පවත්වාගෙන යාමට උපදෙස් ලබා දීම හා ඒ සඳහා පොදු ආකෘති හඳුන්වාදීමත්, නියමිත කාලවකවානු තුළ අනුමාන අයවැය වාර්තාව හා අර්ධ වාර්ෂික අයවැය වාර්තා ඉදිරිපත් කිරීමත්, ඒවායේ නිරවද්‍යතාවය හා නියමිත ආකෘතියට ඉදිරිපත් කිරීමේ වැදගත්කම පිළිබඳවත් සිද්ධස්ථාන භාරකරුවන් දැනුවත් කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වන බව වැඩිදුරටත් සඳහන් කරමි.

   - තවද 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවලගම් ආඥා පනත ප්‍රකාරව සිද්ධස්ථාන ඉඩම් නීත්‍යානුකූලව බදු ගැනීමේ වැදගත්කම පිළිබඳව ඉඩම් බුක්ති විඳින පුද්ගලයන් දැනුවත් කිරීම තුළින් ඉඩම් බුක්තිකරුවන් සුරක්ෂිත කිරීමටත්, ඒ හරහා සිද්ධස්ථාන ඉඩම් අන්සන්තක වීම වළක්වා සිද්ධස්ථාන සතු ඉඩම්වල අයිතිය තහවුරු කිරීමටත් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරමි.

3. ඇතැම් සිද්ධස්ථාන ඉඩම් කොටස් පදිංචිය සඳහා බදු ලබා ගෙන සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යාපාර පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. ඒ හරහා බදුකරුවන් ඉහළ ආදායමක්

උපයෝගනු ලැබුවත් සිද්ධස්ථාන වෙත බදු ලෙස ගෙවනු ලබන්නේ පදිංචිය වෙනුවෙන් තීරණය කර ඇති වටිනාකම පමණි. එවැනි පුද්ගලයන් හඳුනා ගැනීමේ වැඩපිළිවෙළක් සිද්ධස්ථාන භාරකරුවන්ගේද සහයෝගය ඇතිව 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. ඉඩම් කොටස් දීර්ඝකාලීන බදු පදනම මත හෝ වාර්ෂික බදු පදනම මත හෝ බුක්ති විඳින පුද්ගලයන් හඳුනාගෙන බදු ලබා ගෙන නැති ඉඩම් සඳහා බදු ඔප්පු සකස් කිරීමත්, ව්‍යාපාර කරනු ලබන පුද්ගලයන්ගේ බදු මුදල තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තක්සේරු වටිනාකමට සංශෝධනය කර සංශෝධිත බදු ඔප්පු සකස් කිරීමත්, ගැටළුකාරී අවස්ථාවල දී භාරකාර ස්වාමීන් වහන්සේ දැනුවත් කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීමත් සිදු කරන ලදී. ඒ අනුව 2026 වර්ෂයේදී අනෙකුත් පාලනය වන සිද්ධස්ථානවල ඉඩම් සම්බන්ධයෙන්ද කාර්යාල නිලධාරීන් හා සිද්ධස්ථාන භාරකරුවන්ගේ සහයෝගයෙන් එවැනි සමීක්ෂන පැවැත්වීමට බලාපොරොත්තු වේ.

4. එසේම තෝරාගත් සිද්ධස්ථානයක් කේන්ද්‍ර කර ගනිමින් ජංගම සේවයක් පවත්වා බදු ඔප්පු සකස් කිරීමට අදාළ මූලික පියවරයන් සිදු කිරීම 2023/24 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර නියමු ව්‍යාපෘතියක් ලෙස බදුල්ල මුතියංගණ රජ මහා විහාරය සතු ඉඩම් බුක්ති විඳින තොරාගන්නා ලද පිරිසකගේ සහභාගිත්වයෙන් එය සිදු කරන ලදී. අදාළ වැඩසටහන කොමසාරිස් ජනරාල්ගේ හා භාරකාර ස්වාමීන් වහනසේගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර ඊට මෙම දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී හා කාර්යාල නිලධාරීන්ද, වසම් භාර ග්‍රාම නිලධාරීන්ද, නීතිඥවරයෙකුද සහභාගි වූ අතර ඉඩම් බුක්තිකරුවන්ගේ ගැටළු බොහෝමයක් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා උපදෙස් එම අවස්ථාවේදීම ලබා දෙන ලදී. ඒ අනුව එදින සහභාගි වූ පිරිසෙන් 98% ක් පමණ මේ වන විට බදු ඔප්පු සකස් කර ගෙන ඇති බවත්, එය අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා ඇති බවත් සඳහන් කරමි. එහි සාර්ථකත්වය හේතුවෙන් 2026 වර්ෂය තුළදී පාලනය වන සිද්ධස්ථාන කිහිපයක් තොරාගෙන ජංගම සේවාවන් පැවැත්වීමට අපේක්ෂා කරන බව කාරුණිකව දන්වමි.මහියංගනය රජ මහා විහාරය,බෝගොඩ රජ මහා විහාරය,දඹුල්ල රජ මහා විහාරය ආදි තොරාගත් සිද්ධස්ථාන වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

5. මෙම කාර්යාලය මගින් පාලනය වන සිද්ධස්ථාන 91ට අදාළව එක් එක් සිද්ධස්ථානයේ ඡායාරූප, භාරකරු සම්බන්ධ විස්තර, ප්‍රවේශ මාර්ගය, සිද්ධස්ථානය සතු ඉඩම්, බදු ඔප්පු ප්‍රමාණය යනාදී සියළු තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කිරිමට අපෙක්ෂා කෙරේ. එය මෙම වසරේදීද සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම තෝරාගත් සිද්ධස්ථානවල මෙම කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රමදාන සිදු කිරිම හා අඩු පහසුකම් සහිත සිද්ධස්ථානවල සංවර්ධන කටයුතු සිදු කිරිමට රාජ්‍ය ආයතන හා සිද්ධස්ථානවල සහයෝගය ලබා ගැනීමට වැඩපිළිවෙලක් පසුගිය වසරේදී මෙන්ම මෙම වසරේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ.

6. භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත කරීමේදී එම භාණ්ඩයේ බර,උස,දිග සහ පළල සහිතව එම භාණ්ඩයේ ඡායාරූපයක්ද ඇතුළත් කරමින් ලේඛණය සකස් කිරිමෙන් එම භාණ්ඩය වඩා නිවැරදිව හඳුනාගැනීමට හැකියාව ලැබීම.

7. සිද්ධද්ථාන සතු ඉඩම් භාහිර පුද්ගලයින්ට (බදු කරුවන්ට,අනවසර පදිංචි කරුවන්ට සහ බදු අපේක්ෂකයන්ට) හඳුනාගත හැකි පරිදි Google Map ගත කිරීමට අපෙක්ෂා කෙරේ.

8. පසුගිය වසරේ ආරම්භ කරන ලද

- සිද්ධස්ථානවලට අයත් ඉඩම් බදු ලබාදීම සම්බන්ධ දත්ත අන්තර්ජාලය මූලික කර ගත් පරිගණකගත දත්ත පද්ධතියක් තුළ ඇතුළත් කිරීම .
- ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ට අනුකූල වන පරිදි මෙම කාර්යාලය මගින් වෙනත් ආයතන වෙත යවන ලිපි කිහිපයක් එකම කවරයක බහා යොමු කිරීමත්, ආසන්න ආයතන හා සිද්ධස්ථානවලට අදාළ ලිපි අතින් භාරදීමට කටයුතු කිරිමටත් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙම වසරේදීද සිදු කිරීම.

01.5.9.3 මහනුවර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ සුභසාධක වැඩසටහන්

1. මහනුවර දිස්ත්‍රික්කය තුළ තෝරාගත් දුෂ්කර පිරිවෙන් සඳහා පුස්තකාල පහසුකම් සංවර්ධනය කිරීම.
2. කාර්යාල සාමාජික නිළධාරින් අතර සුහදතාවය හා මානසික එකාකාරි බව අවම කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම.
3. දහම් පාසල් කිහිපයක සිසුන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කිරිම සඳහා සම්පත් දායකයන්ගේ සහයෝගයෙන් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම.
4. සාමාජික පවුල් වල කුඩා දරුවන් හා නිළධාරි පවුලේ සාමාජිකයින් සඳහා අවුරුදු උත්සවයක් සංවිධානය කිරීම.

01.5.9.4 මහනුවර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ 2025 වසරේ මතක සටහන්

1. ජාතික ඉතිරි කිරිමේ බැංකු ශාඛාවන්හී කළමණාකරුවන් සඳහා විහාර දේවාලගම් පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන.
2. දිට්වා සුළි කුණාටුවෙන් මිය ගිය අය සිහිගන්වමින් පවත් හන්තාන ත්‍රිපිටක ධර්මායත පිරිවනේදී භික්ෂුන් වහන්සේලා 18 නමකට අෂ්ඨ පරිශ්කාර සහිතව දානමය පුණ්‍ය කර්මය සිදු කිරීම.
3. කාර්යාල නිළධාරින්ගේ මානසික සුවය සඳහා යාපනය ප්‍රදේශයේ සංවිධානය කරන ලද විනෝද චාරිකාව
4. 2025 අවුරුදු කාර්යාලයේ පවුලේ සමාජිකයින් සමඟ පවත්වන ලද අවුරුදු උත්සවය
5. අප කාර්යාලයේ ලේඛණාගාරය විධිමත්ව සකස් කිරීම

01.ජාතික ඉතිරි කිරිමේ බැංකු ශාඛාවන් හී කළමණාකරුවන් සඳහා විහාර දේවාලගම් පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන.

02.දිට්වා සුළි කුණාටුවෙන් මිය ගිය අය සහි ගන්වමින් පවත් හන්තාන ත්‍රිපිටක ධර්මායතන පිරිවනේදී භික්ෂුන් වහන්සේලා 18 නමකට අෂ්ඨ පරිශ්කාර සහිතව දානමය පුණ්‍ය කර්මය සිදු කිරීම

03.කාර්යාල නිළධාරින්ගේ මානසික සුවය සඳහා යාපනය ප්‍රදේශයේ සංවිධානය කරන ලද විනෝද චාරිකාව

04.කාර්යාලයේ පවුලේ සමාජිකයින් සමඟ පවත්වන ලද 2025 අවුරුදු උත්සවය

01.5.10 බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලය - කුරුණෑගල

01.5.10.1 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය පිලිබඳ හැඳින්වීම

බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන විහාරස්ථාන 45 ක් සහ දේවාල 6ක් ඇතුළුව අනෙකුත් සියළුම විහාරස්ථාන වල රාජකාරි කටයුතු ආවරණය කිරීම මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලැබේ.

01.5.10.2 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

- සිද්ධස්ථාන වල අනුමත හා අර්ධ වාර්ෂික ගිණුම් වාර්තා හා අනුමාන අයවැය ඇස්තමේන්තු ගෙන්වා ගැනීම
- පාලනය වන සිද්ධස්ථානවලට භාරකරුවන් පත් කිරීම
- විහාර දේවාල වලට අයත් ඉඩම් බදු දීම
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ දේපල සම්බන්ධ අවශ්‍ය රාජකාරි කටයුතු සිදු කිරීම , බැංකු ගිණුම්වල මුදල් නිදහස් කිරීම
- සිද්ධස්ථානවල ඉඩම්වල ගස් හෙලීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- භාරකාර දෙපාර්තමෙන්තුවේ ඇති මුදල් සිද්ධස්ථාන වල සංවර්ධන කාර්යයන් සඳහා නිදහස් කිරීම
- සාමනේර උපසම්පදා සහතික නිකුත් කිරීම
- විහාරස්ථාන ඉඩම්වල පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු සඳහා අනුමැතිය ලබා දීම
- රජයේ සංවර්ධන කාර්යයන් සඳහා විහාරස්ථාන ඉඩම් ලබා ගැනීමට අනුමැතිය ලබා දීම
- දහම්පාසල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගි වීම

01.5.10.3 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිරි ඉලක්ක

- 4(1) යටතේ පාලනය වන සිද්ධස්ථාන භාරකරුවන් හට අනුමාන අයවැය වාර්තා නිවැරදිව සැකසීම පිළිබඳව දැනුවත් කිරීම.
- බදු ලබාදුන් ඉඩම් විධිමත්ව පරිහරණය වන්නේ ද යන්න පරීක්ෂා කිරීම
- අන් සන්තක වී ඇති සිද්ධස්ථානවලට අයත් ඉඩම් නැවත සිද්ධස්ථාන වෙත ලබා දීමට කටයුතු කිරීම
- බදු ලබා දී නොමැති ඉඩම් බදු ලබා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.
- සාංඝික දේපල පරිහරණය හා අයිතිය සම්බන්ධව විහාරාධිපති ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීම.
- දැනට කාර්යාලය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා වඩා කාර්යක්ෂම සේවයක් ලබා දීමට හැකි ඉඩකඩ ප්‍රමාණවත් පරිශ්‍රයක් සොයාගැනීම

01.5.10.4 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රගතිය

කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ වහලය සකසා ගැනීම සහ වායු සමීකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම වෙනුවෙන් රු 832,113.03 ක ප්‍රතිපාදන වෙන් කිරීම හා අදාල වැඩ විෂය සිදු කිරීම.

01.5.10.5 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ 2025 වර්ෂයේ ප්‍රගතිය

- භාරකරුවන් පත් කිරීමේ සංඛ්‍යාව - 24
- විහාරස්ථාන ඉඩම් බදු දීම - 69
- සාමනේර /උපසම්පදා සහතික නිකුත් කිරීම - 367
- විහාරස්ථාන වල ගැටළු විසඳීම - 48
- විහාරස්ථාන වල අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ මුදල් නිදහස් කිරීම - 14
- ක්ෂේත්‍ර පරීක්ෂණ - 494
- අවිධිමත් ඉඩම් පරිහරණය විධිමත් කිරීම - 25

01.5.11 බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය- රත්නපුර

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය 1982/10/11 වන දින රත්නපුර මුවගම සිරිවිසුද්ධාරාම විහාරසථානයේ දී සිව් දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයකින් යුක්තව ආරම්භ කර ඇත. ඉන් අනතුරුව වර්තමානයේ බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කර ඇති රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය වෙත 1985/06/15 වන දින රැගෙන විත් ඇත.

01.5.11.1 රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය

තනතුර	ප්‍රමාණය
සහකාර කොමසාරිස් (වැඩ බලන)	01
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි	01
සංවර්ධන නිලධාරි	02
කළමනාකරණ සේවා නිලධාරි (එක් නිලධාරිනියක් 2024.07.10 දින සිට වසර පහක් සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇත)	06
කාර්යාල කාර්යය සහායක	01
රියදුරු	01

01.5.11.2 රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

රත්නපුර, මොණරාගල, බදුල්ල යන දිස්ත්‍රික්ක සහ කැගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරකට අදාළව 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ඥා පනත ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව,

දිස්ත්‍රික්කය	4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන	4(2) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන
රත්නපුර	20	574
මොණරාගල	11	373
බදුල්ල	07	398
කෑගල්ල	01	88
එකතුව	39	1433

1. 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත යටතේ හා උපනීති යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
2. විශේෂයෙන්ම පනතේ 4(1) වගන්තියට යටත්ව පාලනයේ පවතින සිද්ධස්ථාන වල ඉඩම්, මූල්‍ය හා වත්කම් පාලනයට සහාය වීම හා ඒවා ආරක්ෂා කිරීමට විධිවධාන සැලසීම.
3. පනතේ 4(2) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන සතු සාංඝික දේපළ ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
4. රත්නපුර, මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක වල පනතෙන් පාලනය වන සිද්ධස්ථාන වල අභිවෘද්ධිය ඇති කිරීම හා පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා සහයෝගය ලබා දීම.
5. සිද්ධස්ථාන සතු පෞරාණික අංගෝපාංගයන් ආරක්ෂා කර ගනිමින් අවශ්‍ය නිවැරදි මග පෙන්වීම් ලබා දීම.
6. සිද්ධස්ථාන සතු දේපල නිසි කළමණාකාරීත්වයෙන් යුක්තව පරිහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධව පසු විපරම් සිදු කිරීම.
7. ආගමික හා සංස්කෘතික අංගයන් ආරක්ෂා කිරීමට මගපෙන්වීම හා සහයෝගය ලබා දීම.

01.5.11.3 රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ 2025 වර්ෂයේ ප්‍රගතිය.

අනු අංකය	රාජකාරි කටයුතු	දිස්ත්‍රික්කය				මුළු ගණන
		රත්නපුර	බදුල්ල	මොණරාගල	කෑගල්ල	
01	භාරකරුවන් පත් කිරීම (අදාළ තොරතුරු විහා.දේ. අංශයට යොමු කිරීම පමණක් සිදු කෙරේ)	09	02	06	01	18
02	ඉඩම් බදු දීම	06	83	33	නැත	122
03	බදු මුදල් සංශෝධනය කිරීම්	නැත	59	25	නැත	84
04	දැව හෙළීම් හා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම	63	01	67	13	144
05	අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු ගිණුම් වලින් මුදල් නිදහස් කිරීම්	06	15	01	නැත	22
06	පූජා ඔප්පු ලබා දීමට අනුමැතිය දීම	නැත				
07	වන්දි මුදල් හා පොළී මුදල් නිදහස් කිරීම්	නැත	01	01	නැත	02
08	විහාරස්ථාන සතු ඉඩම් හා වෙනත් ගැටළු නිරාකරණය කිරීම	නැත	20	15	නැත	35
09	මැණික් ගැරීමට නව බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කිරීම	79	02	03	02	86
10	මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම	147	නැත	02	02	151
11	බදු ආදායම්	රු.122,324,404.77				
12	දැව ආදායම්	රු. 3,013,350.00				
13	පඩුරු ආදායම	රු. 51,588,654.00				
14	මුදල් නිදහස් කිරීම්	රු. 14,055,405.00				

- මෙම කාර්යාලය මගින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ හා කාර්යාල පරීක්ෂණ මගින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට හැකි වූ අතර සිද්ධස්ථාන සතු ඉඩම් වල බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල බදු නොගෙවීම් ගැනද විශේෂ අවධානය යොමු කර ඇත.
- සපරගමු මහ සමන් දේවාලයට බස්නායක නිළමේවරයෙකු තෝරා පත්කරගන්නා තෙක් 2025 පෙබරවාරි 06 දින සිට අගෝස්තු 20 දින දක්වා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් යටතේ පාලනය වන කාල සීමාව තුළ දී සාමාන්‍ය පරිපාලන කටයුතු මෙම කාර්යාලය මගින් ඉටු කරන ලද අතර, 2025 වසරේ ඇසල පෙරහැර මංගල්‍යය සංවිධානය කිරීමද සිදුකරන ලදී.
- විහාර දේවාගලම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සපරගමු මහ සමන් දේවාලය, රුහුණු මහා කතරගම දේවාලය, කිරිවෙහෙර රජ මහා විහාරය, සෙල්ලකතරගම මහසෙන් රජමහා විහාරය යන සිද්ධස්ථාන වල වසරක් තුළදී අවස්ථා කිහිපයකදීම පඬුරු ගණනය කිරීම හා බැංකු ගත කිරීම අධීක්ෂණය කිරීම මෙම කාර්යාලයේ කාර්යය මණ්ඩලය විසින් සිදු කරන ලදී.
- සපරගමු මහ සමන් දේවාලය, සොරගුණේ කුඩා කතරගම දේවාලය, උග්ගල් අළුත්නුවර කතරගම දේවාලය, කොටබෝව කුඩා කතරගම දේවාලය, මැදගොඩ පත්තිනි දේවාලය සහ ශ්‍රී සංබපාල රජමහා විහාරය යන සිද්ධස්ථාන වල පෙරහැර කඩඹිම් වෙන්දේසි ද මෙම කාර්යාලයීය අධීක්ෂණය යටතේ සිදු කරන ලදී.
- එමෙන්ම රුහුණු මහා කතරගම දේවාලය, අම්මඩුව කුඩා කතරගම දේවාලය, උග්ගල් අළුත්නුවර කතරගම දේවාලය, මැදගොඩ පත්තිනි දේවාලය යන සිද්ධස්ථාන සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයන් ද සිදු කරන ලදී.
- රුහුණු මහා කතරගම දේවාලයේ රන් භාණ්ඩ සමීක්ෂණයක් ද මෙම කාර්යාලයේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

01.5.11.4 රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිරි ඉලක්ක

- 2025 වර්ෂයේ ඉටු කළ කාර්යයන් වල අඩුපාඩු මග අරවා ගනිමින් ඒවා තව දුරටත් වැඩි දියුණු කිරීම.
- පනතට අදාළව කටයුතු කිරීමේ දී ගැටළු අවම කර කඩිනමින් නිශ්චිත ඉලක්කයක් වෙත ගමන් කිරීම සඳහා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
- මෙම ප්‍රාදේශීය කාර්යාලයට අදාළ බල ප්‍රදේශය තුළ පිහිටි පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සියළු දේවාල වල භාණ්ඩ සමීක්ෂණයන් සිදු කිරීම සහ භාණ්ඩ ලේඛන පරීක්ෂා කිරීම.
- ඉඩම් ගැටළු විසඳීම, සිද්ධස්ථානයේ හිමිකම තහවුරු කර එහි සුරක්ෂිතතාවය උදෙසා කටයුතු කිරීම, අනවසර භුක්තිකරුවන් විධිමත් භුක්තිකරුවන් බවට පත්කර සිද්ධස්ථානයේ ආදායම් තත්ත්වය වර්ධනය කර, සිද්ධස්ථානය සහ මහජනතාව අතර ගැටුම් ඇති නොවන පරිදි ඔවුන්ගේ බදු අයිතිය තහවුරු කිරීම.
- සිද්ධස්ථාන සතු වත්කම් සහ දේපළ හඳුනා ගෙන ඒවා තව දුරටත් ආරක්ෂා කිරීම සඳහා කටයුතු යෙදීම.
- සේවාලාභීන් සහ කාර්ය මණ්ඩලය අතර සිදුවන රාජකාරි කටයුතු සඳහා වැය වන කාලය අවම කර ගනිමින් වඩාත් කාර්යක්ෂම, සඵලදායි, කඩිනම් සේවාවක් සැපයීම තුළින් තෘප්තිමත් රාජ්‍ය සේවයක් සඳහා දායක වීම.
- කාර්යාලයේ අභ්‍යන්තර සහ බාහිර පරිසරය වඩාත් ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ප්‍රියමනාප කාර්යාල පරිසරයක් නිර්මාණය කරගැනීම.
- සිද්ධස්ථාන සතු ඉඩම් සම්බන්ධයෙන් පවතින කොමසාරිස් ලේඛන කාර්යාලය සඳහා පිටපත් කරගෙන ගබඩාකර පරිශීලනය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන අංශය විසින් 2025 වසරේදී ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

අනුඅංකය	වැඩසටහන / ව්‍යාපෘතිය	2025 අයවැය මගින් වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)	2025.12.31 දිනට වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	විශේෂිත කරුණු
01	රාජ්‍ය වෙසක් උත්සවය	12.0	100%	11.0	
02	සිල්මාතා සංවිධාන	2.0	100%	2.0	
03	නිකාය මූලස්ථානයේ පරිපාලන පිරිවැය	1.2	100%	1.20	
04	නිදහස් දින උත්සවය	1.7	100%	1.70	
05	සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනවල මෙහෙයුම් කටයුතු	6.0	100%	5.40	
06	බෞද්ධ භික්ෂූන් වහන්සේලා පුහුණු කිරිම	3.0	100%	3.0	
07	සිල්මාතා පුහුණුව	3.5	100%	3.50	
08	රාජ්‍ය පොසොන් උත්සවය	5.0	100%	4.81	
09	උපසම්පදා උත්සව	3.2	100%	2.52	
10	ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම	10.0	100%	7.10	
11	බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආදාහන කටයුතු	10.0	100%	3.30	
12	බෞද්ධ විශ්ව කෝෂය මුද්‍රණය කිරීම	5.0	0%	0.0	ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය වෙතින් මේ සඳහා ලබාගත් ඇස්තමේන්තුව අධික වූ බැවින් අමාත්‍ය මණ්ඩල තීරණය මත වෙනත් විශ්ව විද්‍යාල වෙතින් මිල ගණන් කැඳවීමට තීරණය කර ඇති නිසා මෙම කාර්යය ආරම්භ කිරීමට නොහැකිවීම
13	දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම	50.5	100%	49.80	
14	ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු සඳහා පහසුකම් සැපයීම	1.5	100%	1.47	
15	සිල්මාතා ආයතන සංවර්ධනය	20	60%	12.06	මුලටියන සිල්මාතා පුහුණු ආයතන පරිශ්‍රය තුළ ඉදිකිරීම් වලට අදාලව වැඩ අවසන් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම

❖ දහම් පාසල් අංශය විසින් 2025 වසරේදී ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

අනු අං කය	වැඩසහන / ව්‍යාපෘතිය	2025 අයවැය මගින් වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රුමි.)	භෞතික ප්‍රගතිය ප්‍රතිශතය ක් ලෙස (%)	2025.12.31 දිනට වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	විශේෂිත කරුණු
01.	දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම (201-2-2-001-1501)	156	60%	135.713	
02.	දහම් පාසල් විභාග පැවැත්වීම (201-2-2-005-1508)	38.7	80%	17.821	ආපදා තත්ත්වය හේතුවෙන් 6 – 10 ශ්‍රේණි විභාගය නොපැවැත්වුණි.
03.	සමස්ත ලංකා දහම් පාසල් තරඟය (201-2-2-006-1508)	75	80%	45.894	ආපදා තත්ත්වය හේතුවෙන් සිසු නිපුණතා සමස්ත ලංකා වැඩසටහන නොපැවැත්වුණි
04.	ගුරුවරුන් සඳහා පහසුකම් සැපයීම (201-2-2-015-1501)	750	100%	616.691	
05.	දහම් පාසල් ගුරු භවතුන්ගේ සහතික පත්‍ර විභාගය (201-2-2-000-1409(13)	3.8	100%	1.798	
06.	දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව (201-2-211-2202)	10	50%	8.673	
07.	දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන (201-2-2-11-2202)		93%		ආපදා තත්ත්වය හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සැලසුම් කර තිබු ඇතැම් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.
08.	ත්‍රිපිටකයේ ප්‍රකාශන (201-2-2-000-1409(011)	15	85%	7.674	
09.	දහම් පාසල් ගුරුශිෂ්‍ය ලේඛන - 2025 (201-2-2-000-1409(7)	0.2	100%	0.2	
10.	සමස්ත ලංකා දහම් පාසල් දිනය (201-2-2-000-1409)(7)	1	100%	1	
11.	දහම් පාසල් ගුරු හැඳුනුම්පත් (201-2-2-000-1409)(7)	0.2	50%	0.2	
12.	අන්තර් ආගමික සහජීවන වැඩසටහන (201-2-2-000-1409(7)	3	50%	1.187	
එකතුව		1052.9	79%	836.851	

2.2 2026 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් (ඉදිරි ඉලක්ක)

2.2.1 මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකයේ ඉදිරි ඉලක්ක

1. මානව සම්පත් කළමණාකරණ දත්ත පද්ධතිය (DBA HRMS) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථාපන කොට සේවා පහසුකම් සැලසීම.
2. මානව සම්පත් කළමණාකරණ දත්ත පද්ධතිය (DBA HRMS) යටතේ දහම් පාසල්වට අදාළ තොරතුරු දහම් පාසල් වෙතින් සම්පූර්ණ කිරීමේ පහසුකම් ඇති කිරීම.
3. නිකාය පාර්ශ්ව ගරු ලේඛකාධිකාරී නායක ස්වාමින් වහන්සේලා වෙත මානව සම්පත් කළමණාකරණ දත්ත පද්ධතිය (DBA HRMS) හඳුන්වාදීම.
4. කළමණාකරණ දත්ත පද්ධතිය (DBA HRMS) ප්‍රාදේශීය නිලධාරීන් / දහම් පාසල් ප්‍රධානාචාර්යවරු දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් දීපව්‍යාප්තව සිදුකිරීම.
5. ශ්‍රී ලංකාවේ ඒ ඒ නිකාය පිළිබඳ විධිමත් පර්යේෂණාත්මක වාර්තාවක් සකස් කිරීම.
6. ඒ ඒ නිකාය වශයෙන් ශ්‍රී ලංකාවේ විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේ, සිල් මෑණියන් වහන්සේ හා සිල්මාතා ආරාම පිළිබඳ සංගණනයක් කිරීම හා වාර්තාවක් සකස් කිරීම.

2.2.2 සංවර්ධන අංශය විසින් 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය (ඉදිරි ඉලක්ක)

අනු අංකය	වැඩසටහන	2026 ක්‍රියාකාරී සැලැස්මට අනුව අනුමත වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	2026 වසරේ සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කය ප්‍රතිශතයක් ලෙස (%)
01	රාජ්‍ය වෙසක් උත්සවය	12.0	100%
02	සිල්මාතා සංවිධානහා ජාතික සිල්මාතා සමුළුව	5.0	100%
03	නිකාය මූලස්ථානයේ පරිපාලන පිරිවැය	1.2	100%
04	ජාතික නිදහස් දින උත්සවය	2.0	100%
05	සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනවල මෙහෙයුම් කටයුතු	8.0	100%
06	බෞද්ධ භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම	3.0	100%
07	සිල්මාතා පුහුණුව	3.5	100%
08	රාජ්‍ය පොසොන් උත්සවය	5.0	100%
09	උපසම්පදා උත්සව	3.5	100%
10	ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම	10.0	100%
11	බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආදාහන කටයුතු	10.0	100%
12	බෞද්ධ විශ්වකෝෂය මුද්‍රණය කිරීම	5.0	100%
13	දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම	83.0	100%
14	සිල්මාතා ආයතන සංවර්ධනය	20.0	100%
15	ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු සඳහා පහසුකම් සැපයීම	-	100%

2.2.3 දහම් පාසල් අංශය විසින් 2026 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් (ඉදිරි ඉලක්ක)

අනු අංකය	වැය විෂය/ වැය ශීර්ෂය	2026 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රතිපාදන (රු.මි.)	2026 වර්ෂයේ සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කය (%)
01.	දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම (201-2-2-001-1501)	202	100%
02.	දහම් පාසල් විභාග පැවැත්වීම (201-2-2-005-1508)	29	100%
03.	සමස්ත ලංකා දහම් පාසල් තරඟය (201-2-2-006-1508)	57	100%
05.	දහම් පාසල් ගුරුභවතුන්ගේ සහතිකපත්‍ර විභාගය (201-2-2-000-1409(13)	3	100%
06.	දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව (201-2-211-2202)	15	100%
07.	දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන (201-2-2-11-2202)		100%
08.	ත්‍රිපිටකයේ ප්‍රකාශන (201-2-2-000-1409(011)	9	100%
09.	දහම් පාසල් ගුරුශිෂ්‍ය ලේඛන - 2025(201-2-2-000-1409(7)	0.5	100%
10.	සමස්ත ලංකා දහම් පාසල් දිනය (201-2-2-000-1409)(7)	1.75	100%
11.	දහම් පාසල් ගුරු හැඳුනුම්පත් (201-2-2-000-1409)(7)	0.9	100%
12.	අන්තර් ආගමික සහජීවන වැඩසටහන (201-2-2-000-1409(7)	4	100%
13.	අධ්‍යාත්මක සංවර්ධනය සහ දහම් පාසල් කළමනාකරණය (201-2-2-000-1409(7)	1.15	100%
14.	නියමු දහම් පාසල් සංවර්ධන වැඩසටහන (201-2-2-000-1409(7)	1	100%
එකතුව		324.3	

2.3 විශේෂ ජයග්‍රහණ හා අභියෝග

2.3.1 දහම් පාසල් අංශයේ විශේෂ අභියෝග

- සිසුන් දහම් පාසලට පැමිණීම වර්ධනය කර ගැනීම සහ දහම් අධ්‍යාපනයට වැඩි නැඹුරුවක් ඇති කරලීම.
- දහම් පාසල් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම හා ආකල්ප, ගුණධර්ම වැඩිදියුණු කිරීම.
- දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා ගුණාත්මකව වර්ධනය කිරීම.

2.3.2 නීති අංශයෙහි විශේෂ ජයග්‍රහණ හා අභියෝග

2025 වසර තුල අලුතින් නඩු 25 ක් ගොනු කර ඇති අතර පෙර වසර වල ගොනු කල නඩු හා අලුතින් ගොනු කල නඩු වලින් නඩු 13 ක ප්‍රමාණයක් 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා අවසන් කර ඇත. ගරු අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම මත බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් නඩු 28 කින් මුදා හැර ඇති අතර මෙම නඩු කටයුතු තවදුරටත් අධිකරණ වල විභාග වේ. තවද සීමිතව පවතින මානව සම්පත හා භෞතික සම්පත උපරිම ලෙස යොදා ගනිමින් බෞද්ධ කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ නීතිමය කටයුතු සිදු කිරීම.

2.3.3 රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ විශේෂ ජයග්‍රහණ

- මෙම කාර්යාලයීය පාලනයේ පවතින සිද්ධස්ථාන කිහිපයකම භාණ්ඩ සමීක්ෂණ සිදු කර ඒවාල දේපල සම්බන්ධයෙන් විධිමත් ලේඛන සැකසීමට අවශ්‍ය මූලික පියවර ගැනීමට හැකි වීම.

2.3.4 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ විශේෂ ජයග්‍රහණ හා අභියෝග

- කාර්යාලයේ අබලන්ව පැවති වහලය අළුත්වැඩියා කර වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම.
- දැනට කාර්යාලය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා කාර්යාලය පවත්වාගෙන යාමට ඉඩකඩ ප්‍රමාණවත් පරිශ්‍රයක් සොයාගැනීම.

2.3.5 මහනුවර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ විශේෂ අභියෝග

1. පදිංචිය සඳහා බදු ලබා දීමේදි නාගරික මෙන්ම ග්‍රාමීය ඉඩම් සඳහා එක සමාන බදු මුදලක් අය කිරිම හේතුවෙන් ඉස්මතු වන අසමතුලිතතාවය නිසා සිද්ධස්ථාන ඉඩම් බදු වශයෙන් ලබා ගැනීමට එම ඉඩම්වල බුක්තිකරුවන් ඉදිරිපත් නොවීම. ඒ හේතුවෙන් සිද්ධස්ථාන ඉඩම්වල අයිතිය අන්සන්තක වීමේ හැකියාවක් තිබීම , සිද්ධස්ථානයට ආදායම් අහිමි වීම.

2. එසේම පර්චස් 40 ඉක්මවන ඉඩම් හා ව්‍යාපාරික කටයුතු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන තක්සේරු වටිනාකම ඉහළ අගයක් වීම හා එම තක්සේරු වටිනාකම තීරණය කරන ආකාරය ගැටළු සහගත වීම. එම නිසා බදුකරුවන් වැඩි බදු මුදලක් ගෙවීමට එකඟ නොවීම හේතුවෙන් බදු ඔප්පු සකස් කිරීමට අකමැති වීම හා බදු මුදල් සංශෝධනය කිරීමට ඉල්ලුම් කිරීම. ඇතැම් අවස්ථාවල බදු ඔප්පු සකස් නොකර වාර්ෂික බදු පදනම මත ඉඩම් කොටස් බුක්ති විඳීම.
3. නිරන්තර සිහිකැඳවීම් සිදු කරන නමුත් සිද්ධස්ථානවල අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අය වැය වාර්තා නිසි වේලාවට ලබා නොදීම හා ඒ සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට නොහැකි වීම.

4. සිද්ධස්ථාන ඉඩම් බදු දීමේදී ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා නිරවුල්භාවය පිළිබඳ වාර්තාව සැපයීමේදී වසම භාර ග්‍රාම නිලධාරීවරයාට හා ඊට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්ට, බදු දීමට යෝජිත ඉඩම් කොටස නිශ්චිතව හඳුනා ගැනීමේ අපහසුතා පැවතීම.

5. රාජකාරි ලිපිගොණු විශාල ප්‍රමාණයක් මෙම කාර්යාලය සතුව තිබෙන අතර ඒවා ආරක්ෂිත ලෙස ගබඩා කිරිම සඳහා පවතින කබඩ් ප්‍රමාණවත් නොවීම හා විනාශ කළ නොහැකි පැරණි ලිපිගොණු ආරක්ෂිතව තබා ගැනිමට ලේඛනාගාරය තුළ ප්‍රමාණවත් ඉඩකඩ නොතිබිම.

6. නිළවරණයන් ආසන්නයේ භාරකරුවන් නිරන්තයෙන් මාරු වීම තුළින් අඛණ්ඩව පවත්වාගෙන යන (වසර 5ක කාලය සඳහා) ක්‍රමවේදයන් ක්ෂණිකව වෙනස් වීම තුළ බදු ලබා ගැනීමේ කර්යට එය සෘජුව බලපානු ලබයි.එම භාරකරුවන් නාමිකව පමණක් ධුරයේ කටයුතු කරන අතර ඒ අතර කාලය තුළ බදු ගොනු වලට අදාල කටයුතු අනවශ්‍ය ප්‍රමාදයකට එය හේතු වේ.

2.3.6 අභ්‍යන්තර විගණන අංශයේ විශේෂ අභියෝග

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන වල ගිණුම් කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාමට අදාළ කාර්යය මණ්ඩලය යොමු කිරිම. ඉදිරිපත් කරන විගණන වාර්තා වලට අදාළව ගත් ක්‍රියාමාර්ග සහ පිළිතුරු පිළිබඳ වාර්තා ගෙන්වා ගැනීමේ අභියෝගයකි.

03 පරිච්ඡේදය- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය.

03.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	සත්‍ය 2025 රු.	සත්‍ය 2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		778,709,000	651,155,000	ඒසීඒ-3
-	තැන්පතු		25,253,177	4,308,915	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම		33,927,165	31,667,081	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**837,889,342**	687,130,996	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**837,889,342**	687,130,996	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		837,889,342	687,130,996	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
686,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	681,211,213	578,802,908	ඒසීඒ-2(ii)
197,190,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	161,075,253	124,599,594	ඒසීඒ-2(ii)
952,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	820,292,563	670,114,024	ඒසීඒ-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
1,835,490,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,662,579,029**	1,373,516,526	
	මූලධන වියදම්				
5,510,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	5,188,008	4,056,628	ඒසීඒ-2(ii)
46,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,629,639	11,044,341	ඒසීඒ-2(ii)
82,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	71,998,003	64,126,304	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
500,000	හැකියා වර්ධනය	14	499,392	361,997	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
134,510,000	**මුළු මූලධන වියදම් (උ)**		**83,315,042**	79,589,270	
	තැන්පතු ගෙවීම්		20,636,256	3,276,097	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		48,866,837	33,086,471	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		69,503,093	36,362,568	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,815,397,164	1,489,468,364	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(977,507,822)**	(802,337,368)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		-	(802,337,368)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3

1

03.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	253,281,771	247,182,717
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම	ඒසීඒ-5/5(ඒ)	93,954,867	79,015,197
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**347,236,638**	**326,197,914**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		86,041,630	75,718,881
දේපළ පිරියත හා උපකරණ සංචිතය		253,281,771	247,182,717
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසීඒ-4	7,913,237	3,296,316
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**347,236,638**	**326,197,914**

පිටු අංක 7 සිට 47 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 59 සිට 105 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 2026.02.20
දිනය :	දිනය : 2026/02/	

ප්‍රින්ස් සේනාධීර
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත.
කොළඹ 07.

ආර්.එම්.ජී. සේනාරත්න
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
දහම්පාය, අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත.
කොළඹ 07

ජී.බී.එල්. රංජනී
ප්‍රධාන ගණකාධිකාරි
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
"දහම්පාය"
අංක. 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත.
කොළඹ 07

03.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තතය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	45,876,522	32,174,577
අග්‍රිම ලැබීම්	778,709,000	651,155,000
අත්තිකාරම් අයකර ගැනීම්	32,817,487	31,808,371
තැන්පතු ලැබීම්	25,253,177	4,308,915
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**882,656,186**	**719,446,863**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	748,214,319	643,774,213
සහනාධාර සහ මාරුකිරීම්	29,422,226	18,833,093
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	6,802,419	8,958,494
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	23,115,159	735,275
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	48,866,837	33,086,472
තැන්පතු ගෙවීම්	20,636,256	3,276,097
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**877,057,216**	**708,663,644**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**5,598,970**	**10,783,219**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	5,598,970	10,783,219
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**5,598,970**	**10,783,219**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(5,598,970)**	**(10,783,219)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය (රු.000)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස
20.02.02.99	පොලිය - අනෙකුත්	3,000	-	1,324.446	44%
20.03.99.00	විකිණුම් ගාස්තු - අනෙකුත් ලැබීම්	3,500	-	1,572.884	45%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය (රු.000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	1,837,000	1,835,490	1,661,077.187	90.5%
ප්‍රාග්ධන	133,000	134,510	83,315.041	62%

3.7 මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (රු.000)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාල රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	මෙම දෙපාර්තමේන්තුවට අදාල විවිධ කාර්යයන් ඉටු කිරිම වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදීම මෙම දෙපාර්තමේන්තුවට අයත් මුද්‍රණ කාර්යයන් ඉටුකර ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදීම	1,032,175.51		952,349.84	92.27%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය (රු.000)

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	76,482,172
9152	යන්ත්‍රෝපකරණ	125,975,683
9153	ඉඩම්	8,500,000
9154	අස්පෘශ්‍ය වත්කම්	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-
9160	කෙරීගෙන යන වැඩ	42,323,915
9180	බදු දෙන ලද වත්කම්	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඑෆ්/සී/ඩීබීඑ/2/2026/16 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2026 ජුනි 18 දින

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශය පරිදි අපහරණය කරන ලද ලී බඩු උපකරණ, පරිගණක උපකරණ හා කාර්යාල අයිතම 28 කට අදාල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ශේෂයෙන් අඩුකර දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද මුළු වියදම, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-6 ආකෘතියේ) වර්ෂයේ මිලදී ගැනීම්වල වටිනාකමට සමාන විය යුතු වුවද, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ රු.5,629,639 ක් දක්වා තිබුණු අතර, ACA 6 ආකෘතිය යටතේ එය රු.5,598,970 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 30,669 ක වෙනසක් පැවතුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 6ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.84,040,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.33,759,281ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 34 සිට සියයට 67 දක්වා පරාසයක පැවතුණි.

(ආ) මූලධන වැය විෂයයන් දෙකක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු. 63,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 48,750,765 ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 95 ක් හා සියයට 40ක් විය.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා ප්‍රතිපාදිත රු. 5,500,000 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 5ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තුව රු.76,000 සිට රු.20,000,000 දක්වා පරාසයක් තුළ සංශෝධනය කර තිබුණු අතර එය අදාල වියදම් විෂයයන්ගේ ප්‍රතිපාදනවලට සියයට 33 සිට 250 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඉ) මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.1,400,000ක් වූ මුල් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා රු.2,910,000ක් වූ සංශෝධිත ප්‍රතිපාදනය අතර රු. 1,510,000ක විචලතාවයක් පැවතුණු අතර එම විචලතාවය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 108ක් විය.

(ඊ) 2025 සහ 2024 වර්ෂවලදී 201-1-1-1202-10 වැය විෂයය යටතේ වෙනත් කටයුතු සඳහා ඉන්ධන වෙනුවෙන් රු.500,000 බැගින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වෙන් කර ගෙන අදාල ප්‍රතිපාදන රු.454,000 සහ රු.479,000 බැගින් එනම් මූලික වියදම් ඇස්තමේන්තුවෙන් පිලිවෙළින් සියයට 91 සහ 95 බැගින් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණ ද ඉතිරි ප්‍රතිපාදිත මුදල ද අදාල අරමුණ වෙනුවෙන් වැය කර නොතිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) 2025 මාර්තු 22 අයවැය චක්‍රලේඛ අංක 01/2025 අනුව රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් වන විධිවිධාන විස්තීරණව දක්වමින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි වියදම් පාලන උපදෙස් සහ දැනට වලංගුව පවතින අනෙකුත් චක්‍රලේඛවල සෙසු වියදම් පාලන උපදෙස් කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු වේ. ඒ අනුව 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව අතිකාල දීමනා, නිවාඩු දින වැටුප්, වෙනත් දීමනා සහ

ගමන් වියදම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ පමණක් වියදම් දැරීම සඳහා බැඳීම් ඇති කර ගත යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් 201-1-1-0-1002 යටතේ ප්‍රතිපාදන ඉක්මවා රු.1,541,270ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) 2026 වර්ෂයේ වවුචර අංක P2602/39 මගින් ගෙවීම කර 201-1-1-0-1402 වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබූ වටිනාකම රු.19,937 ක් වූ දෙසැම්බර් මසට අදාල දූරකථන බිල්පත් වියදම 2025 වර්ෂයේ බැරකම් යටතේ ඇතුලත් කර නොතිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, 4.1.2 (ඇ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	සම්මත පරිදි නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756(6)	2024 භාණ්ඩ සමීක්ෂණයට අදාලව පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම, භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සහ භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධ කටයුතු නිම කළ බවට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම පිළිවෙලින් මාස 2-3 අතර කාල ප්‍රමාදයකින් යුතුව සිදු කර තිබුණි.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය	ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2025 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මෙම වාර්තාවේ දිනය වන විටත් අදාල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 9ක් සම්බන්ධයෙන් ඒ

අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ

(i) VI ඡේදය

අතිකාල රාජකාරි සම්බන්ධයෙන් තමන් කරන ලද නිර්දේශයන් සෑම මාස තුනකට වරක්ම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සමාලෝචනය කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

(ii) VII ඡේදය

ජාතික උත්සව ආදී විශේෂ අවස්ථා සම්බන්ධයෙන් වන විට එම විශේෂ කාලසීමාව ඇතුළත කටයුතුවලදී, අතිකාල සේවාවන් පිළිබඳව තක්සේරුවක් ඉදිරිපත් කර ඒ සඳහා ගෙවීම් ප්‍රමාණය ගැන අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව පෙබරවාරි මස සංවිධානය කරන නිදහස් පිරිත හා මැයි මස සංවිධානය කරන ජාතික වෙසක් උත්සවයන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර අදාල මාසයට පසු මාසයේදී එම අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත යවා තිබුණි.

3.5 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් සමහර ශ්‍රේණිවලට මුදල් ගෙවීම පිළිබඳ 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ලිත් මාසයකට දින දෙකකට වැඩි දින ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු අතර ඒ අනුව ගෙවීම් කළ යුතු වේ. එසේ වුවද, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් 2024 මාර්තු 2 සිට ඔක්තෝබර් 27 දක්වා දින 25ක් සඳහා පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර සේවයේ යෙදීමෙන් අනතුරුව අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එම දිනයන්හි සේවයේ යෙදීම වෙනුවෙන් අදාළ නිලධාරියා වෙත රු.141,725ක මුදලක් නිවාඩු දින වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

3.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම හා පියවීම

මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 7කදී එකතුව රු.194,490ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 18 සිට 34 දක්වා කාල ප්‍රමාදයක් ගත වී තිබුණි.

3.7 තැන්පතු

වසර දෙකකට වඩා පැරණි, එකතුව රු.1,369,258ක් වූ තැන්පතු තුනක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා (3) විධි විධානවලට අනුව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුවේ. එසේ වුවද, 2025 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා දී තිබුණේ 2025 අප්‍රේල් 11 දින වේ.

4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර තිබුණු අතර එම වාර්තාවේ පහත අඩුපාඩු පැවතුණි.

(අ) දහම් පාසල් අංශය විසින් 2025 වසරේදී ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය යටතේ දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සඳහා අයවැය මඟින් වෙන් වූ සමස්ථ ප්‍රතිපාදනය වූ රු.මි.0.2ක මුදල වැය කර තිබූ නමුත් භෞතික ප්‍රගතිය සියයට 50ක් පමණක් විය.

(ආ) කාර්යසාධන වාර්තාවේ ඇතුළත් අනුකූලතා වාර්තාව අනුව දෙපාර්තමේන්තුව විසින් අනුකූල වී නොමැති අවශ්‍යතා 6ක් සම්බන්ධයෙන් අනුකූල වන බව වාර්තා කර තිබුණි.

(ඇ) 2025 මැයි 25 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව අදාළ කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූයේ 2025 ජූලි 12 දින වේ.

4.2 වත්කම් කළමනාකරණය

(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව 2025 වර්ෂය සඳහා වූ වත්කම් මිලදී ගැනීම හා අපහරණය පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු අංක 56-9231 වෑන් රථය 2025 ජනවාරි මස 24 දිනෙන් පසු ධාවනයේ යොදවා නොතිබූ අතර මෙම වෑන් රථය අලුත්වැඩියා කිරීම ඵලදායීද නැද්ද

යන්ත පිළිබඳ තාක්ෂණික නිර්දේශය සඳහා 2026 ජනවාරි 23 දින ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව මෙම රථය අපහරණය කිරීම සඳහා කටයුතු කිරීම වඩාත් ඵලදායී බව යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් 2026 පෙබරවාරි 09 දින නිර්දේශ කර තිබුණි. ඒ අනුව අදාල රථය වසරකට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණු අතර අපහරණය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

සමාලෝචිත වර්ෂයට අදාළව ඇප තැබිය යුතු නිලධාරීන් සිව් දෙනෙකු විසින් ඇප් තැබීම පිළිබඳව විගණනයට සනාථ කර ගැනීමට නොහැකි විය.

4.4 පාඩු හා හානි

(අ) මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 7කට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම ඉදිරිපත් කළ යුතු වුවත් අවස්ථා දෙකකදී සිදු වූ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීම මාස දෙකකට වඩා ප්‍රමාද වී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පරීක්ෂණයෙන් පසු, අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2025 මාර්තු 09 දින හානියට පත් වූ කාර් රථය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව මාස 4ක් ප්‍රමාද වී 2025 ඔක්තෝබර් 22 දින ඉදිරිපත් කර තිබූ අතර 2025 ඔක්තෝබර් 08 දින හානියට පත් වූ වෑන් රථය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව මාස 5ක් ප්‍රමාද වී 2026 මාර්තු 24 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් "බී" ගිණුම පරිදි මිය ගොස් වසර 03ක් ඉක්ම වූ නිලධරයකුගෙන් අයවිය යුතු රු.100,060ක හිඟ ණය ශේෂයක් අය කර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 (I) හි 02.I ඡේදය අනුව සියලුම රාජ්‍ය සේවකයන් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කිරීම සිදු කළ යුතු වුවත් 2025 සැප්තැම්බර් දක්වාම දෙපාර්තමේන්තුවේ රියැදුරු තනතුරට අදාළ නිලධාරීන් නව දෙනෙකු (09) ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 835 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 725ක් විය. මෙහිදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06ක් ද ද්විතීයක මට්ටමේ පුරප්පාඩු 99ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 5ක් ද වශයෙන් මුළු පුරප්පාඩු ගණන 110ක් පැවතුණි.

කේ.එච්.යූ.වී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක.

4.1 කුරුණෑගල බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	89%-75%	74%-50%	50%ට අඩු
අයවැය වාර්තා				
2025 වර්ෂය තුළ දී පළමු අර්ධ වාර්ෂික වාර්තා	100%			
2025 වර්ෂය තුළ දී දෙවන අර්ධ වාර්ෂික වාර්තා				30%

4.2 නීති ඒකකයෙහි කාර්ය සාධන දර්ශක

2025.01.01 සිට 2025.12.31 දක්වා නඩු පිළිබඳ විස්තර			
2025.01.01 පවතින නඩු ප්‍රමාණය	වසර තුල ගොනු කල නඩු ප්‍රමාණය	අවසන් වූ නඩු ප්‍රමාණය	ඉතිරි නඩු ප්‍රමාණය
119	25	13	131

විශේෂිත දර්ශක	ලැබී ඇති විෂය ගොනු ප්‍රමාණය	ඉටු කළ ප්‍රමාණය	ඉතිරිය
විවිධ ගොනු	43	ගොනු 40 කට නිරීක්ෂණ ලබා දී ඇත	03 ක් ඉතිරිව ඇත
විවිධ ලිපි	116	අවශ්‍ය කටයුතු සිදු කර ඇත (110 ලිපි)	06 ක් ඉතිරිව ඇත

4.3 මහනුවර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයෙහි කාර්යය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	89% - 75%	74% - 50%	50%ට අඩු
1. අයවැය වාර්තා දේවාල				
1.2025 වර්ෂය තුළදී පළමු අර්ධ වාර්ෂික වාර්තා ලැබීම්	✓			
2.2025 වර්ෂය තුළදී දෙවන අර්ධ වාර්ෂික වාර්තා ලැබීම්	✓			
3.2025 වර්ෂය සඳහා අනුමාන අයවැය වාර්තා ලැබීම්	✓			

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	89% - 75%	74% - 50%	50%ට අඩු
1. අයවැය වාර්තා විහාරස්ථාන				
2025 වර්ෂය තුළදී පළමු අර්ධ වාර්ෂික වාර්තා ලැබීම්		✓		
2025 වර්ෂය තුළදී දෙවන අර්ධ වාර්ෂික වාර්තා ලැබීම්		✓		
2025 වර්ෂය සඳහා අනුමාන අයවැය වාර්තා ලැබීම්		✓		

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු.

තිරසාර සංවර්ධන අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			00-49	50-74	75-100
1. දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම (ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයට ප්‍රවේශවීමේ අවස්ථාව තහවුරු කිරීම)	සියලුම ඉගෙනුම් ලාභීන් සඳහා දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම මගින් තිරසාර සංවර්ධන ඉලක්ක තහවුරු කිරීම	රාජ්‍ය මැදිහත් වීමෙන් ආධාර ලබාදුන් දහම් පාසල් සංඛ්‍යාව හා දහම් අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව		✓	
2.සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන වලට පහසුකම් සැපයීම (ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා සාධනීය අවස්ථාවන් ලබාදීම)	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මත උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශ වීමට ඇති අවස්ථා තහවුරු කිරිම.	පුහුණු ආයතනවල වාර්ෂිකව පාඨමාලා හදාරන සිල්මැණියන් වහන්සේලා		✓	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.

ළමා සමාජය ඵලදායී හා විනයගරුක කිරීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් වෙනුවෙන් ඉරිදා දිනයන්හි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර ස්වෙච්ඡා ගුරුවරුන්ගෙන් පමණක් දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සිදු වී තිබීම අභියෝගයකි. තවද ඉරිදා දින දරුවන් සඳහා උපකාරක පන්ති පැවැත්වීම මත දරුවන් දහම් පාසල් වෙත පැමිණීම දුර්වල වීමත් ළමා සමාජය තුළ දහම් දැනුම වර්ධනය කිරීමට පවතින අභියෝගයකි.

නමුත් මේ වන විට දහම් අධ්‍යාපනය ලැබිය යුතු දරුවන්ගෙන් විශාල ප්‍රමාණයක් ඒ සඳහා යොමු වී තිබීම ලබාගත් විශාල ජයග්‍රහණයකි.

2018 වසරට අදාලව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවට අනුව ඉහළ කාර්ය සාධනයක් අත්කරගත් ආයතන සඳහා සම්මාන පිරිනැමීමේදී මෙම දෙපාර්තමේන්තුව රන් සම්මානයක් හිමි කර ගැනීම හා 2018 ,2019 වර්ෂ සඳහා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය මඟින් සංවිධානය කරනු ලැබූ රාජ්‍ය අංශයෙහි හොඳම ගිණුම් වාර්තා කිරීමේ ආයතන අතරට පැමිණීමද සුවිශේෂී ජයග්‍රහණයකි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ.

අංකය	තනතුර	වැටුප් කේත අංකය	සේවය	සේවා ශ්‍රේණිය	පන්තිය/ ශ්‍රේණිය	අනුමත සේවක සංඛ්‍යාව			සේවයේ නියුතු නිලධාරී සංඛ්‍යාව			පුරප්පාඩු
						ස්ථිර	කොන්ත්‍රාත්	වැඩ බැලීම	ස්ථිර	කොන්ත්‍රාත්	වැඩ බැලීම	
01	බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්	SL 3-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	විශේෂ	1	0	0	1	0	0	0
02	අතිරේක කොමසාරිස් ජනරාල්	SL 3-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	විශේෂ	1	0	0	1	0	0	0
03	බෞද්ධ කටයුතු කොමසාරිස්	SL 1-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	I	4	0	0	4	0	0	0
04	ප්‍රධාන ගණකාධිකාරී	SL 1-2016	ශ්‍රී.ලං.ග.සේ	ජ්‍යෙෂ්ඨ	I	1	0	0	1	0	0	0
05	ප්‍රධාන අභ්‍යන්තර විගණක	SL 1-2016	ශ්‍රී.ලං.ග.සේ	ජ්‍යෙෂ්ඨ	I	1	0	0	1	0	0	0
06	නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්	SL 1-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	II/ III	6	0	0	2	0	1	3
07	ගණකාධිකාරී	SL 1-2016	ශ්‍රී.ලං.ග.සේ	ජ්‍යෙෂ්ඨ	II/ III	1	0	0	1	0	0	0
08	නීති නිලධාරී	SL 1-2016	දෙපාර්තමේන්තුගත	ජ්‍යෙෂ්ඨ	III	1	0	0	1	0	0	0
09	ප්‍රධාන කර්තෘ	SL 1-2016	කොන්ත්‍රාත්	ජ්‍යෙෂ්ඨ		0	1	0	0	0	0	1
10	නියෝජ්‍ය/ සහකාර කර්තෘ	SL 1-2016	කොන්ත්‍රාත්	ජ්‍යෙෂ්ඨ		0	2	0	0	0	0	2
11	පරිපාලන නිලධාරී	MN 7-2016	ක.සේ.නි.සේ.	තෘතියික	අධි	1	0	0	1	0	0	0
12	තොරතුරු තාක්ෂණ නිලධාරි	MN 6-2016	ශ්‍රී.ලං.තො.තා.සේ.	ද්විතියික	I/II	02	0	0	0	0	0	2
13	බෞද්ධ කටයුතු සමායෝජක	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		8	0	0	8	0	0	0
14	සංවර්ධන සහකාර	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		3	0	0	3	0	0	0
16	සහායක නීති නිලධාරී	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		1	0	0	1	0	0	0
17	සංවර්ධන නිලධාරී	MN 4-2016	සං.නි.සේ	ද්විතියික		711	0	0	625	0	0	86
18	කළමනාකරණ සේවා නිලධාරි	MN 2-2016	ක.සේ.නි.සේ.	ද්විතියික	I/ II/III	51	0	0	40	0	0	11
19	රියදුරු	PL 3-2016	ඒ.රි.සේ	ප්‍රාථමික		12	0	0	12	0	0	0
20	බංගලා භාරකරු	PL 2-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	0	0	0	1
21	කාර්යාල සේවක සේවය	PL 1-2016	කා.සේ.සේ.	ප්‍රාථමික	I/ II/III	20	0	0	18	0	0	2
22	ලොරි සහායක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		2	0	0	0	0	0	2
23	බංගලා භාරකරු සහායක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
24	කාර්යාල කාර්ය සහයක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
25	බංගලා භාරකාරු සහයක (වාරිකාරාම)	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
26	මුරකරු (මුලටියන)	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
එකතුව						832	3	0	724	0	1	110

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	19	13	06
තෘතියික	01	01	00
ද්විතියික	776	677	99
ප්‍රාථමික	39	34	5
	835	725	110

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය

❖ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු පවතින බැවින් පරිපාලන කටයුතු සිදු කිරීමේ දී රාජකාරිමය වශයෙන් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ආතති කළමණාකරණය, ආකල්ප වර්ධනය හා පෞරුෂ සංවර්ධනය පුහුණු වැඩසටහන	60	පැය 06	රු.19,223.00		දේශීය	කාර්යාලීය රාජකාරි වල දී නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව අන්තර් සහයෝගීතාව වර්ධනය කිරීම.
දෙදින පුහුණු වැඩසටහන - වක්වැල්ල	80	පැය 12	රු. 334,168.80		දේශීය	රජයේ ප්‍රසම්පාදන පටිපාටිය, මුදල් රෙගුලාසි ආශ්‍රිත දැනුම, නිලධාරීන්ගේ විනය පටිපාටික රීති ආශ්‍රිත දැනුම, ආයතන සංග්‍රහය ආශ්‍රිත දැනුම, සුපිළිපන් රාජ්‍ය සේවයක් ඇති කිරීම.
රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය	01	අවුරුදු 01	රු.80,000.00		දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය ආශ්‍රිත දැනුම

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	√		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	√		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම			
3.1	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යායාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	√		
3.2	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	√		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	√		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	√		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	√		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	√		

අං කය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරිමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරිම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	√		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර සිටීම	√		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරිම සම්බන්ධීකරණය කිරිම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරිම	√		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර සිටීම	√		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	√		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරිම මු.රෙ 772 අනුව සිදු කිරිම	එවැනි භාණ්ඩ නැත		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම	√		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	√		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරිම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.06.29 දිනැති අංක2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරිම	√		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	√		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	එවැනි ගිණුම් නැත		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්දයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	√		
12	රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට අනුකූල වීම	√		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	-		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	-		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබිම			
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම	√		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබිම	ශේෂ නොමැත.		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	√		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කොට තිබීම	-		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	√		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතඉදිරිපත් කර තිබීම	√		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	√		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	√		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරිම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබිම	√		
19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අඩුම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	√		
19.3	ඉහත චක්‍රලේඛනයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	X	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 I හා 2023.11.30 දිනැති චක්‍රලේඛය අනුව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරිම අවශ්‍ය නොවේ.	
19.4	ඉහත චක්‍රලේඛ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරිම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරිම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමපිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබිම	√		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	√		